# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා

# බාහිර උපාධි පාඨමාලා විවරණිකාව

# 2023

කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා
# බාහිර උපාධි විවරණිකාව - 2023

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

# කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා බාහිර උපාධි පාඨමාලා විවරණිකාව - 2023

# UNDERGRADUATE PROSPECTUS – 2023

**FOR**

**BACHELOR OF COMMERCE (GENERAL) EXTERNAL DEGREE**

**BACHELOR OF SCIENCE MANAGEMENT (PUBLIC) GENERAL (EXTERNAL) DEGREE**

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## University of Sri Jayewardenepura

### විශ්වවිද්‍යාලයීය ලාංඡනය - The Emblem of the University

---

### විශ්වවිද්‍යාලයීය ආදර්ශ පාඨය - The Motto of the University

**“විජ්ජා උප්පතතං සෙට්ඨා”**

---

### විශ්වවිද්‍යාලයීය දැක්ම - The Vision of the University

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

---

### විශ්වවිද්‍යාලයීය මෙහෙවර - The Mission of the University

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයන්ගෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ගීතය
## Anthem of University of Sri Jayewardenepura



ශ්‍රී ලංකා පින්බර රන් දෙරණේ
ශ්‍රී නිවාස වූ මහ අගනගරේ
ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ
ශ්‍රී නාමය රැඳවවු ලෝ මුදුනේ

භික්කඛුවේ සිරි සුමඟුල් සමිඳුන්
වැලිවිටියේ සෝරත බඳු යතිඳුන්
බිහිකළ විද්‍යෝදය විදු බිම දුන්
එළියෙන් - දිවි මග සරසවු

අයුක්තියේ දී විවාදශීලී
අසත්‍යයේ දී විචාරශීලී
වියත් සබා මැද සමාජශීලී
වියතුන් වී දැය පොබයවු
විජ්ජා උප්පතතං සෙට්ඨා..//

**ගේය පද රචනය**
සේවාර්පිත මහාචාර්ය සුනිල් ආරියරත්න

**තනු නිර්මාණය සහ සංගීතය**
ආචාර්ය රෝහණ වීරසිංහ

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා බාහිර උපාධි විවරණිකාව

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

ISBN-978-955-9054-73-3

**සංස්කරණය**

මහාචාර්ය එම්.ඩී. පුෂ්පකුමාරි මිය - ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.එම්.එන්. වීරතුංග මයා - රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය

කථිකාචාර්ය ඩී.එන්. පණ්ඩිතසේකර මිය - වාණිජවිද්‍යා අධ්‍යයනාංශය

**සම්බන්ධීකරණය**

එල්.එල්. වසන්ත පෙරේරා (නියෝජ්‍ය ලේඛකාධිකාරි - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය)

ඒ. ඩී. එස්. සමාදරී (සහකාර ලේඛකාධිකාරි - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය)

**පිට කවරය**

යසිරු ද සිල්වා (වැඩසටහන් සම්පාදක - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය)

| පටුන | පිටු අංකය |
|---|---|


1.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ………………………………………………………… 11

2.කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය ……………………………………………….. 12

3.බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය …………………………………………………… 13 - 15

4.විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව …….................... 16 - 37

5.වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව ……………………………………………….. 38- 58

6.විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ ……………………………………………………………….. 61

7.විභාග අක්‍රමිකතා සහ දඬුවම්……………………………………………………… 62 – 63

8.උපාධි ප්‍රදානෝත්සවය සහ විශේෂ කරුණු…………………………………………… 64– 65

# උපකුලපතිතුමන්ගේ පණිවිඩය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පත්මලාල්**
**උපකුලපති**

වසර 60කට අධික ඉතිහාසයකට උරුමකම් කියනු ලබන දකුණු ආසියාවේ විශිෂ්ටතම කළමනාකරණ අධ්‍යයන පීඨය ලෙස ගෞරවය දිනා ගත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා බාහිර උපාධි අපේක්ෂකයෙකු වශයෙන් ඇතුළත් වන ඔබට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස පළමුවෙන් මාගේ සුභාශිංසන එක් කරනු කැමැත්තෙමි.

සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ඔබගේ ජීවිතයේ වැදගත්ම අධ්‍යාපනික කඩඉම ජය ගැනීමට තෝරා ගැනීම සම්බන්ධයෙන් ඔබ සැබැවින්ම ආඩම්බර විය යුතුය. රාජ්‍ය විශ්වවිද්‍යාල අතරින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඉදිරියෙන්ම සිටිනුයේ වර්තමානයේ පවතින තරඟකාරී අධ්‍යාපන ක්‍රමය තුල විශිෂ්ට ජයග්‍රහණ ලබමින් තම පැවැත්ම අඛණ්ඩව පවත්වා ගැනීම හේතුවෙනි. පරිපූර්ණ දැනුමින් අනූන බුද්ධිමතුන් බිහි කරනු වස් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇත. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය නිරන්තරයෙන් උත්සාහ දරනුයේ වර්තමාන ලෝකයේ තරඟකාරී රැකියා වෙළඳපොලට ගැලපෙන අයුරින් ඉලක්ක ජය ගත හැකි උපාධිධාරීන් දැයට බිහි කිරීමටයි. වත්මන් කළමනාකරණ ක්ෂේත්‍රය තුල විවිධ අංශ නියෝජනය කිරීම සඳහා ඕනෑම අභියෝගයක් ජය ගත හැකි ඉහළ ආත්ම විශ්වාසයකින් හා දැනුමින් පරිපූර්ණ බුද්ධිමතුන් බිහි කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ප්‍රමුඛතම අරමුණක් වන අතර පීඨය මගින් පිරිනමන වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධිය සහ විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය යන උපාධි ත්‍රිත්වය හැදෑරීමේ මහඟු අවස්ථාව ඔබට හිමිවේ.

තම සිහිනය සැබෑ කරගනිමින් උපාධිධාරියෙකු ලෙස බිහිවීම ඔබට සැබැවින්ම අභියෝගාත්මක කටයුත්තක් වුවද එම භාරදූර කටයුත්ත ඉටු කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් වගකීමෙන් කටයුතු කරනු ඇත. ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් සැදුම්ලත් ප්‍රවීණ දේශක මණ්ඩලය මෙන්ම සුහදශීලී කාර්ය මණ්ඩලයද ඔබේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් අවශ්‍ය නොමඳ සහයෝගය සහ මගපෙන්වීම ලබා දෙනු ඇත.

විශිෂ්ටත්වය කරා යන ගමනේදී ගුණාත්මකභාවය ඉතා වැදගත් කොට සැළකිය යුත්තකි. ඉහළ ප්‍රමිතිගත දැනුමින් යුතු උපාධිධාරියෙක්, සමාජයට වඩාත් වැඩදායී ගුණාත්මකභාවයෙන් යුතු විනයගරුක පුද්ගලයෙක් වීමද අනිවාර්ය වේ. මේ සඳහා අවශ්‍ය මානසික දියුණුව මෙන්ම තම කුලසතාවයන් වර්ධනය සඳහාද විශ්වවිද්‍යාලය තුල ඔබට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව හිමිවනු ඇත.

විශිෂ්ට උපාධිධාරියෙක් ලෙස බිහිව ජීවිතයේ සියළු අභියෝග ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ධ්‍යෛර්‍ය ලැබේවායි මාගේ සුභාශිංසන එක් කරනු ලබන අතර ඔබ ලබා ගත් දැනුම සහ අත්දැකීම් තුලින් යම් දිනෙක ඉහළ ඵලදායීත්වයකින් යුතුව රටෙහි සංවර්ධනයට දායක වනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමි.

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය - පීඨාධිපතිතුමාගේ පණිවිඩය



**ආචාර්ය දුෂාන් ජයවික්‍රම**
**පීඨාධිපති**
**කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය**

කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන බාහිර උපාධි පාඨමාලා ශිෂ්‍ය අත්පොතෙහි මෙම පණිවිඩය ප්‍රකාශයට පත් කිරීමට ලැබීම පිළිබඳව මා අතිශයින් සතුටට පත්වෙමි. මෙරට පුරෝගාමී කළමනාකරණ පීඨය වන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියට සහ ජාතියට කළමනාකරණ අධ්‍යාපනය හඳුන්වා දීම සම්බන්ධයෙන් ආඩම්බර වන අතර එම නිසා ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ඨතා මධ්‍යස්ථානය ලෙස නම දිනාගෙන ඇත. උසස් පෙළ විභාගයෙන් පසු කළමනාකරණ විෂය ක්ෂේත්‍රයෙහි උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන සිසුන්ගේ පළමු සහ ප්‍රමුඛතම තේරීම ද අපගේ පීඨයයි. එසේ වුව ද, අභ්‍යන්තර ශිෂ්‍යය බඳවා ගැනීම් ප්‍රමාණය සීමා සහිත වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කළමනාකරණ පීඨයේ අධ්‍යාපනය හැදෑරීමේ සිහිනය සැබෑ කර ගැනීමට වාසනාවන්ත වන්නේ සිසුන් සුළු පිරිසක් පමණි.

කෙසේ වෙතත්, සීමිත අවස්ථා හේතුවෙන් අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස උසස් අධ්‍යාපනය හැදෑරීමට නොහැකි වූ ඔබට, සුදුසුකම් ලත් කළමනාකරණ උපාධිධාරියෙකු වීමේ සිහිනය සැබෑ කර ගනිමින්, පිළිගත් උපාධියක් ලබා ගැනීම සඳහා අවස්ථාව කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය විසින් ඔබට විවෘත කර දී ඇත. අපගේ බාහිර උපාධි පාඨමාලා වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළ හැදෑරූ සිසුන්ට පමණක් නොව ජීව විද්‍යාව, ගණිතය, කලා වැනි අනෙකුත් විෂය ධාරාවන්හි සිසුන් සඳහා ද විවෘත ය. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ සියලුම විශ්වවිද්‍යාල අතරින් කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ ඉහළ ම සුදුසුකම් ඇති හොඳම අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අපගේ පීඨය සමන්විත වන අතර ඔවුන්ගෙන් දැනුම ලබා ගැනීමට සිසුන් වශයෙන් ඔබ වාසනාවන්ත බව ඉමහත් සතුටින් සඳහන් කිරීමට කැමැත්තෙමි. වසර 60කට අධික කාලයක් කළමනාකරණ ක්ෂේත්‍රයේ විෂය දැනුම හා ප්‍රඥත්වය උත්පාදනය කරමින් රටට අසමසම සේවාවක් කළ මෙම කීර්තිමත් පීඨයෙන් සාර්ථකව උසස් අධ්‍යාපනය නිමකර කුසලතාපූර්ණ උපාධිධාරියෙකු ලෙසින් නික්ම යෑමට ඔබට හැකි වේවා යන්න මාගේ අවංක ප්‍රාර්ථනාවයි. එබැවින් මෙම පීඨයේ අනාගත උපාධිධාරියෙකු ලෙස, මේ රටේ ජනතාවගේ ජීවිත නගා සිටුවීමේ වගකීම ඔබ විසින් ඉටු කරනු ඇතැයි මම අවංකවම විශ්වාස කරන අතර ඒ සඳහා ඔබට ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

## අධ්‍යක්‍ෂ ස්වාමින් වහන්සේගේ පණිවිඩය



මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි
අධ්‍යක්ෂ
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නිර්මාතෘවර අතිගෞරවාර්හ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේගේ ඒකායන අපේක්‍ෂාව වූයේ විදුදය සරසවි දරුවන් විවිධ විෂය ක්‍ෂේත්‍රයන්හි ප්‍රවීනයන් බවට පත් වී ජාතියේ අභිමානය ඉහළට ඔසවා තබනු දැකීමයි. එම අභිලාසය මුදුන් පමුණුවන්නට එක්වන ඔබට ප්‍රථමයෙන් ම බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙනුවෙන් සුභාසංශන පිරිනමමු. ඔබ වැනි අභ්‍යන්තර සරසවි වරම් අහිමි වූ දැයේ දූ පුතුන් වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බාහිර උපාධි පාඨමාලා ආරම්භ කරන ලද්දේ මීට අඩසියවසකටත් එහා කාලයක සිට ය. එදා සිට මේ දක්වා කළමනාකරණ හා වාණිජ විද්‍යා ක්‍ෂේත්‍රයෙහි ප්‍රවීනත්වය ලැබූ දහස් සංඛ්‍යාත බාහිර උපාධිධරයන් රැසක් බිහි කරන්නට හැකි වූ බව සඳහන් කරන්නේ හදපිරි සතුටිනි. මෙකී සුවිසල් කාර්යභාරයේ දී කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයත් තදානුබද්ධව ක්‍රියාත්මක වන රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයත්, ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයත් සහ වාණිජ විද්‍යා අධ්‍යයනාංශයත් සිදු කරන සේවාව මිල කළ නොහැකිය. 2023 වූ කලී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වසර 150 ක පෞඪ ඉතිහාසය සනිටුහන් කරන වර්ෂයයි. ක්‍රි.ව. 1873 දී කොළඹ මාළිගාකන්දේ ආරම්භ වූ විද්‍යෝදය පිරිවෙන විශ්වවිද්‍යාලයේ මූලාරම්භයයි. එනයින් ගත් කල ශත වර්ෂ එක හමාරකට අධික කාලයක් පුරා ලද අත්දැකීම් සහිත වු වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකාවේ විශාලතම ජාතික විශ්වවිද්‍යාලය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්‍ෂකත්වය ලැබූ ඔබට එම පීඨයේ සිටින මනා පළපුරුද්දක් සහිත විෂය ප්‍රාමාණික ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට අවස්ථාව ලැබීම ඔබගේ අධ්‍යාපන ගමන් මගේ නොමැකෙන සිහිවටනයක් වනු ඇත. නූතන තරඟකාරී වැඩ ලෝකයට මනා ලෙස අනුගතවූත්, දැනුමෙන් හා කුසලතාවෙන් පරිපූර්ණවූත් උපාධිධරයෙකු බිහි කිරීමේ අරමුණින් කලින් කලට යාවත්කාලීන වන එකිනෙකට වෙනස් උපාධි පාඨමාලා තුනක් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් ඉදිරිපත් කර ඇත. දෙස් විදෙස් ශ්‍රම වෙළඳපොලෙහි ඉල්ලුම සැපිරියහැකි වූ ද, විෂය දැනුමෙන් හා හැකියාවෙන් පෝෂණය වූ ද, අභියෝග ජය ගත හැකි වූ ද උපාධිධරයෙකු බිහිකිරීම පරමාර්ථ කොට නූතන ලෝකයට ගැලපෙන පරිදි එම උපාධි පාඨමාලාවන්හි ව්‍යූහය හා ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කර තිබේ.

හිතාදර ශිෂ්‍ය ශිෂ්‍යාවනි, උසස් පෙළ විභාගය සමත්ව ඉතා සුලු ලකුණු ගණනකින් ජාතික විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු බවට පත්වීමට නොහැකි වූ ඔබට දැන් එකී අවස්ථාව වෙනත් අයුරකින් උදා වී ඇත. එම අභියෝගය ජය ගැනීමට හැකි කුසලතාවත්, මනා කැපවීමත්, උනන්දුවත්, නොපසුබට උත්සාහයත් ඔබ සතුව පවතින බැව් අපි තරයේම විශ්වාස කරමු. ඒ සඳහා සියලු පහසුකම් සපයා දෙමින් නව තාක්ෂණය සමඟ අත්වැල් බැඳගෙන මාර්ගගත හා මාර්ගගත නොවන ක්‍රමවේද ඔස්සේ ඉගැන්වීම් සහ ඇගයීම් සිදු කරමින් ඔබට සහාය වන්නට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය නිරන්තරයෙන් ඔබ සමග රැඳී සිටින බව අවධාරණය කරනු කැමැත්තෙමි.
වර්තමානයේ අප රට මුහුණ පා සිටින දැඩි ආර්ථික අර්බුදය විසඳීමෙහිලා වඩාත් ඵලදායී දායකත්වයක් සැපයිය හැකි කළමනාකරණ හා වාණිජ විද්‍යා ක්ෂේත්‍රයෙහි ඉහළ ප්‍රවීනතාවක් ලැබූ උපාධිධරයකු බවට පත් වීම සඳහා ඔබට දිරිය හා ශක්තිය නොමඳව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.
තෙරුවන් සරණයි!

## ලේඛකාධිකාරීතුමාගේ පණිවිඩය



ඒ.බී. වැලිවිට
ලේඛකාධිකාරී

2023 වසර සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා නවක උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සකස් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා විවරණිකාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

දිවයිනේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට බාහිර උපාධි අපේක්ෂකයකු ලෙස ලියාපදිංචි වී උසස් අධ්‍යාපනය හැදෑරීමට ඔබ විසින් ගනු ලැබූ බුද්ධිමත් තීරණය මා සමස්ථ පරිපාලනය වෙනුවෙන් අගය කරමි. එය අප දකිනුයේ අප විශ්වවිද්‍යාලයේ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යයන වැඩසටහන් සහ විශිෂ්ඨ කළමනාකරණය කෙරෙහි ඔබ තැබූ විශ්වාසයක් ලෙසිනි.

ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචියේ සිට උපාධි සහතිකය ලබාගැනීම දක්වා සමස්ත ක්‍රියාවලිය තුල නවීන තාක්ෂණය භාවිතා කරමින් කඩිනම් හා සුහදශීලී සේවයක් ලබාදීමට සමස්ත කාර්යය මණ්ඩලයම කැපවී සිටින බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ඔබ උපාධිය හදාරන කාලය තුළ ඔබට යම් පරිපාලනමය කාර්යයක් ඉටුකර ගැනීමට සිදුවුවහොත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර ලේඛකාධිකාරී, නියෝජ්‍ය ලේඛකාධිකාරී, අධ්‍යක්ෂ හෝ ලේඛකාධිකාරීවරයා හමු වී එය කඩිනමින් නිරාකරණය කරගැනීමේ හැකියාවක් ඇති බව දන්වනු කැමැත්තෙමි.

# 1.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් වර්ෂ 1883 මාළිගාකන්ද හි ආරම්භ කරන ලද විද්‍යෝදය පිරිවෙන 1958, අංක 45 දරන විශ්වවිද්‍යාල පනත යටතේ වර්ෂ 1959 දී විශ්වවිද්‍යාල තත්වයට උසස් කෙරිණ. ඉන් පසු, එය ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය වශයෙන් නම් කරන ලදී. 1978 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර නගරය ශ්‍රී ලංකාවේ පරිපාලනමය අග නගරය වශයෙන් නම් කළ බැවින්, ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි නාමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (USJP) යනුවෙන් නැවතත් වෙනස් කරන ලදී. දැනට එය පිහිටා ඇත්තේ නුගේගොඩ, ගංගොඩවිල ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අක්කර 55 ක පමණ භූමිභාගයක පැතිර පවතින අතර අභ්‍යන්තර සිසුන් 16,000 ක් පමණ අධ්‍යයන කටයුතු හදාරනු ලැබේ. මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතු අධ්‍යාපන පීඨ සංඛ්‍යාව එකොළහකි. එනම්, මානව ශාස්ත්‍ර සහ සමාජවිද්‍යා, ව්‍යවහාරික විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා, වෛද්‍ය විද්‍යා, පශ්චාත් උපාධි, ඉංජිනේරු, තාක්ෂණ, සම සෞඛ්‍ය, දන්ත වෛද්‍ය, නාගරික හා ජලජ ජෛවසම්පත් හා පරිඝණක පීඨයන්ය. අධ්‍යාපනය හා ගවේෂණය තුළින් වටිනා ශ්‍රී ලාංකේය පුරවැසියන් නිර්මාණය කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූලික අරමුණයි. භෞතික හා අධ්‍යාත්මික වශයෙන් පෝෂණය වූ පරිපූර්ණ පුද්ගලයන් බිහි කිරීම හා ඔවුන්ට නිසි දැනුම ලබාදීම සම්බන්ධයෙන් දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් අන් කිසිදු විශ්වවිද්‍යාලයකට නොදෙවෙනි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, අද වන විට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාල අතරින් එකක් බවට පත් වී ඇත.

## 2.කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය (FMSC) කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 55කට වැඩි ප්‍රෞඪ ඉතිහාසයකින් යුත් පුරෝගාමී අධ්‍යයන පීඨයක් ලෙස හැඳින්විය හැකිය. මේ වන විට කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සිය විජයග්‍රාහී ඉතිහාසය පුරා සිසුන් 40,000ක ට වැඩි සංඛ්‍යාවක් ඉතා සාර්ථක අන්දමින් ජයග්‍රහණයේ මාවත වෙත යොමු කර ඇත. ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන්, කාලයේ අවශ්‍යතාවට ගැලපෙන ලෙස යාවත්කාලීන කර ඇති වැඩසටහන් හරහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ලබාදෙන දායකත්වය නිසා ම අද වන විට කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය 'ශ්‍රී ලංකාවේ කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ට මධ්‍යස්ථානය' ලෙස ගෞරවයට පාත්‍ර වී ඇත.

උසස් ගණයේ බුද්ධිමතුන් නිර්මාණය කිරීමේදී කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් ලබා දී ඇති දායකත්වය අති මහත්ය. මනා ශාස්ත්‍රීය ඥානයෙන් යුත් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ උපාධිධාරියකු උගත්කමින් පමණක් නොව සාරධර්ම හා ප්‍රායෝගික දැනුම අතින් ද ඉහළ මට්ටමක සිටී. සැම අතින් ම දක්‍ෂතා සපිරි උපාධිධාරීන් බිහිකිරීම පිණිස කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් දේශීය මෙන් ම ජාත්‍යන්තර වෘත්තීය ආයතනයන් සමඟ ද ඉතා සමීප සබඳතාවයකින් යුතුව කටයුතු කරයි. සිසුන්හට, විෂයන් 60ක ට වැඩි සංඛ්‍යාවකින් යුත් උපාධි පාඨමාලා 12ක ට ආසන්න ගණනක් හැදෑරීමේ අවස්ථාව අප විසින් සලසා ඇත. නව්‍යකරණ හා බුද්ධිමය වශයෙන් සිසුන් හැඩගැස්වීම උදෙසා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් පර්යේෂණයන් කෙරෙහි සිසුන් යොමු කරවනු ලබයි. ඊට අමතරව, කීර්තිමත් පුරවැසියකු තුළ තිබිය යුතු අනිවාර්ය දක්‍ෂතාවන් වන සන්නිවේදන කුසලතා, කණ්ඩායම් කටයුතු කුසලතා, නායකත්ව කුසලතා සහ මෘදු කුසලතා යනාදියෙන් පරිපූර්ණවීමට සිසුන්ට අවශ්‍ය සියලු පහසුකම් ද කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සපයනු ලබයි.

උපාධි අපේක්‍ෂක මට්ටම (අභ්‍යන්තර හෝ බාහිර) හෝ පශ්චාත් උපාධි මට්ටමේ ඉගෙනුම ලැබීමට බලාපොරොත්තු වන ඕනෑම අයෙකුට වඩාත් ම ගැලපෙන ස්ථානය වන කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, බාහිර සිසුන් සඳහා පහත දැක්වෙන උපාධි පාඨමාලා තුන (03) පිරිනමනු ලබයි.

1. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
2. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලව
3. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

## 3.බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචිය

### 3.1. ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම වාර්ෂිකව සිදු කෙරේ. මේ සඳහා පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය සහ සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ www.external.sjp.ac.lk නිල වෙබ් අඩවිය මගින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීම සිදු කරනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල වෙබ් අඩවිය මගින් වන අතර අයදුම්කරුවන් වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් යොමු කළ යුතුය.

### 3.2. ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛනයන්ට අනුකූලව අදාල අධ්‍යයන වර්ෂය සඳහා සීමිත උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. ඉදිරිපත්ව ඇති අයදුම්පත් සංඛ්‍යාව අපේක්ෂිත සීමාව ඉක්මවා යන අවස්ථාවලදී අධ්‍යයනාංශය මගින් තීරණය කරනු ලබන සාධාරණ ක්‍රමවේදයක් මගින් නිශ්චිත ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගනු ලැබේ.

### 3.3. ලියාපදිංචි අංකය සහ ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කිරීම

බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම් කර සුදුසුකම් සපුරා ඇති සෑම ශිෂ්‍යයෙකු සඳහාම ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ලියාපදිංචි අංකයක් සහිත ශිෂ්‍ය වාර්තා පොතක් විශ්වවිද්‍යාලය මගින් නිකුත් කරනු ලැබේ. සිය අධ්‍යයන කටයුතු කරගෙන යාමේ දී විශ්වවිද්‍යාලය සමඟ කෙරෙන සෑම කාර්යකදීම එම ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එම ශිෂ්‍ය වාර්තා පොතෙහි ඇති ලියාපදිංචි අංකය විශ්වවිද්‍යාලය සම්බන්ධ වන සෑම අවස්ථාවකදීම සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. තමා ලියාපදිංචි වූ උපාධිය ලබා ගන්නා තෙක් මෙම ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලය සතු වන අතර උපාධිය ලබා ගැනීමෙන් පසු ශිෂ්‍ය වාර්තා පොතේ අයිතිය අපේක්ෂකයා සතුවේ. බාහිර උපාධි අපේක්ෂකයකුගේ ලියාපදිංචිය අවලංගු කළ විට, ඔහුගේ ශිෂ්‍ය වාර්තා පොත විශ්වවිද්‍යාලයට භාර දිය යුතුය. බාහිර ශිෂ්‍ය වාර්තා පොත අස්ථානගත වූ විට ඒ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් කළ යුතු අතර, එම පොලිස් වාර්තාව සමඟ උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සහ අදාළ ගෙවීම් කර වවුචරය සමඟ අතිරේක ඡායාරූපයක් ඉදිරිපත් කිරීමෙන් එහි පිටපතක් ලබා ගත හැකි වේ.

**09/2021 අංක දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත සකස් කරනුයේ ඔබගේ උප්පැන්න සහතිකයේ ඇති නමට වන අතර උපාධි සහතිකය සකස් කරනුයේද උප්පැන්න සහතිකයේ නමට වේ. පවත්නා නීතිරීති අනුව ලියාපදිංචියෙන් පසුව ඔබගේ නමෙහි යම් සංශෝධනයක් වේ නම් එය ඔබගේ උපාධි III පරීක්ෂණයට පෙර බාහිර උපාධි** හා **විස්තාරිත පාඨමාලා ඒකකය වෙත අවශ්‍ය නීත්‍යානුකූල ලේඛන සමග දැන්විය යුතු වේ. ඉහත චක්‍රලේඛයට අනුව ප්‍රතිඵල වලංගු දිනට පසුව උපාධි අපේක්ෂකයින්ගේ නමෙහි සංශෝධනය සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප වේ.**

## 3.4. ලියාපදිංචි කාලසීමාව

**බාහිර උපාධි පාඨමාලා සඳහා ප්‍රථමයෙන්ම අධ්‍යයන වර්ෂ තුනක කාල සීමාවකට ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. එම නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වන උපාධි අපේක්ෂකයකු වෙතොත් ඔහු හෝ ඇය තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගැනීම සඳහා නියමිත කාලයේදී ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එක් වසරක් සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ ගාස්තුව වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ රු.5,000/- ක් වන අතර විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ රු.7,000/කි. මෙලෙස ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අවස්ථා 04ක් හිමිවන අතර ලියාපදිංචිය වලං**ගුවන සම්පූර්ණ කාලය අධ්‍යයන වර්ෂ 07කි.

ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා වූ අයදුම්පත්, ගෙවීම් වවුචර්පත් සහ අදාල විස්තර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ **www.external.sjp.ac.lk** වෙබ් අඩවියෙහි Registration ⟶ Registration Renewal මගින් ලබා ගත හැකිය.

## 3.5. අධ්‍යයන වර්ෂයක් යනු -:

අධ්‍යයන වර්ෂයක් ලෙස අර්ථ දැක්වෙන්නේ කිසියම් පාඨමාලාවකට ලියාපදිංචි වීමේ සිට උපරිම මාස දොළහක් සම්පූර්ණ වන ලිත් වර්ෂයකි. එකී වර්ෂය ඇතුලත අදාල අවසන් පරීක්ෂණ පැවැත්විය යුතුය. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා අදාල අධ්‍යයන වර්ෂයට නියමිත පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට නොහැකි වුවහොත් අධ්‍යයන වර්ෂයක හිමිකම උපාධි අපේක්ෂකයන්ට ලැබෙන පරිදි පහත සඳහන් ක්‍රියාකාරී නිර්වචනය භාවිතයට ගත යුතුය.

බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වූ දින සිට උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය ප්‍රථම අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය දෙවන අධ්‍යයන වර්ෂය වේ. එතැන් සිට උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ අවසන් වන දිනය දක්වා කාලය තුන්වන අධ්‍යයන වර්ෂය වේ.

ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුනක් ඉක්ම යන තෙක් ලියා පදිංචිය වලංගු වේ. එම කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ තුනකටත් (03), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ දෙකකටත් (02), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ එකකටත් (01) පෙනී සිටීමේ අවස්ථාව මුල් ලියාපදිංචියේදී උපාධි අපේක්ෂකයන්ට හිමි වේ.

උක්ත සඳහන් නිර්දේශප්‍රකාරව ප්‍රථම ලියාපදිංචියේ සිට අධ්‍යයන වර්ෂ තුන ඇතුලත උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වන අපේක්‍ෂකයින් සිවුවන අධ්‍යයන වර්ෂය සඳහා තම ලියාපදිංචිය දීර්ඝ කරගත යුතුය. එලෙස අලුත් කරන ලද අධ්‍යයන වර්ෂය තුළ දී උපාධි I, II සහ III කොටස සඳහා පවත්වනු ලබන එක් පරීක්ෂණයකට බැගින් පෙනී සිටීමේ අවස්ථාව උපාධි අපේක්ෂකයන්ට හිමි වේ.

මේ ආකාරයට උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීම සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ අවස්ථා හතරක් එක් අපේක්ෂකයකුට හිමි වේ. ඒ අනුව මුල් ලියාපදිංචි අධ්‍යයන වර්ෂ තුනද ඇතුලත්ව සමස්ත පාඨමාලාව අවසන් කිරීම සඳහා අධ්‍යයන වර්ෂ හතක් (07) සෑම අපේක්ෂකයකුටම හිමි වේ. මෙම අධ්‍යයන වර්ෂ හතක (07) කාලය තුළ උපාධි I කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හතකටත් (07), උපාධි II කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ හයකටත් (06), උපාධි III කොටස සඳහා පවත්වනු ලබන පරීක්ෂණ පහකටත් (05) පෙනී සිටීමේ අවස්ථාව උපාධි අපේක්ෂකයන්ට හිමි වේ.

| | උපාධි කොටස | පරීක්ෂණ ගණන |
|---|---|---|
| උපරිම අධ්‍යයන වර්ෂ 07 | උපාධි I | 07 |
| | උපාධි II | 06 |
| | උපාධි III | 05 |

## 3.6. ලියාපදිංචිය අවලංගු කිරීම

***ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුළු ලියකියවිලි වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේදී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කිරීමට; විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි අවස්ථාවක ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු නොලැබේ.***

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ඔබ විසින් ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

## 3.7. ලියාපදිංචිය අවලංගු කිරීමේ දී ගාස්තු නැවත ගෙවීම

ලියාපදිංචිය අවලංගු කිරීමේදී ලියාපදිංචි ගාස්තු (රු.15,000/-) නැවත ගෙවනු නොලැබේ. එහෙත් **ලියාපදිංචි දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම් සඳහා පමණක්** ගෙවන ලද **ලියාපදිංචි ගාස්තු හැර** පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. **මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

# 4. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව

## 4.1. හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය යටතේ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව 1997 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබීය. මෙම පාඨමාලාවට අදාල සියලුම අධ්‍යයන කාර්යයන් හා පරිපාලන කටයුතු රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය විසින් මෙහෙයවන අතර බාහිර අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම හා පරීක්ෂණ පැවැත්වීම මෙම විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් සිදුවේ.

**පාඨමාලාවේ අරමුණු**

- ශ්‍රී ලංකාවේ කළමණාකරණ හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයට අදාළ දැනුම වර්ධනය කිරීම.
- දැනට විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වීමට නොහැකි වූ එහෙත් ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රය තුළ උපාධි පාඨමාලාවක් හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයන්ට ඒ සඳහා අවස්ථාවක් සලසා දීම.
- පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්හට වැඩිදුර අධ්‍යාපනයට අවස්ථාව සලසා දීමෙන් එම ආයතනය හා රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය අතර සම්බන්ධතාව තවදුරටත් වර්ධනය කිරීම.
- උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවිශ්ට වීමට බලාපොරොත්තුවන්නන්හට ඒ සඳහා අවස්ථාව සලසා දීම.

## 4.2. ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් තුනක් එක් වතාවකදී සමත් වීම. (නව හෝ පැරණි නිර්දේශය)

හෝ

(ආ) රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර සේවයේ වසර තුනක පලපුරුද්ද තිබීම හා එකවර අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් දෙකක් සමත් වීම. (නව හෝ පැරණි නිර්දේශය)

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් වෙනත් සුදුසුකම් (ඇමුණුම අංක 01-පිටු අංක 36)

හෝ

(ඉ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි ඉහතින් නම් නොකරන ලද වෙනත් සුදුසුකම්

සහ

ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අධ්‍යයන වර්ෂයේ ජනවාරි 01 වන දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම.

මෙහි (ඈ) සහ (ඉ) යටතේ ලියාපදිංචිය අපේක්ෂා කරන්නන් විසින් ඉල්ලුම් කිරීමට ප්‍රථම ස්වකීය සුදුසුකම් පිළිබඳ විස්තර සඳහන් ලිපියක් අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් ද සමඟ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී මගින් රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 4.3. වාර්ෂික ශිෂ්‍ය ප්‍රවේශය හා තෝරා ගැනීමේ පටිපාටිය

වාර්ෂිකව බඳවාගනු ලබන සිසුන් ප්‍රමාණය සහ තෝරා ගැනීමේ ක්‍රමවේදය සෑම අධ්‍යයන වර්ෂයකදීම රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලැබේ.

## 4.4. විෂයමාලා ව්‍යුහය

විෂය මාලාව අනිවාර්ය විෂයයන් 19කින් සමන්විතය.

**උපාධි I කොටස**

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| MEX 1501 (a) සහ (b) | කළමනාකරණ ක්‍රියාවලිය සහ කාර්යාල කළමනාකරණය | 75 | 5 |
| MEX 1502 | දේශපාලන විද්‍යාව | 75 | 5 |
| MEX 1503 | සූක්ෂම ආර්ථික විද්‍යාව | 75 | 5 |
| MEX 1504 | මූල්‍ය ගිණුම්කරණය | 75 | 5 |
| MEX 1505 | තොරතුරු තාක්ෂණය හැඳින්වීම | 75 | 5 |
| MEX 1506 | ගණිතය හා සංඛ්‍යානය | 75 | 5 |
| MEX 1007 | අනිවාර්ය ඉංග්‍රීසි | Non-credit | |

## උපාධි II කොටස

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| MEX 2501 | රාජ්‍ය පරිපාලන විද්‍යා න්‍යාය හා පරිචය | 75 | 5 |
| MEX 2502 | සංවිධාන චර්යාව හා සමාජ විද්‍යාව | 75 | 5 |
| MEX 2503 | සාර්ව ආර්ථික විද්‍යාව | 75 | 5 |
| MEX 2504 | ව්‍යාපෘති කළමනාකරණය | 75 | 5 |
| MEX 2505 | අලෙවි කළමනාකරණය | 75 | 5 |
| MEX 2506 | ව්‍යවස්ථා පරිපාලනය හා වාණිජ නීතිය | 75 | 5 |

## උපාධි III කොටස

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| MEX 3501 | රාජ්‍ය ප්‍රතිපත්ති | 75 | 5 |
| MEX 3502 | සංවර්ධන පරිපාලනය | 75 | 5 |
| MEX 3503 | රාජ්‍ය මූල්‍ය | 75 | 5 |
| MEX 3504 | සංවර්ධන ආර්ථික විද්‍යාව | 75 | 5 |
| MEX 3505 | මානව සම්පත් කළමනාකරණය | 75 | 5 |
| MEX 3506 | මූල්‍ය කළමනාකරණය | 75 | 5 |

## 4.5. පාඨමාලාවේ කාලය

පාඨමාලාවේ කාලය අධ්‍යයන වර්ෂ තුනක් වේ.

## 4.6. මාධ්‍යය

සිංහල

**සටහන** : ඉංග්‍රීසි මාධ්‍යය හඳුන්වා දීම පිළිබඳ පාඨමාලාව සඳහා ඇති ඉල්ලුම සහ පවත්නා සම්පත් සලකා බැලීමෙන් පසු අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලැබේ.

## 4.7. පාඨමාලා ගාස්තු

| ලියාපදිංචි ගාස්තු | පළමු වාරිකය | දෙවන වාරිකය | තෙවන වාරිකය |
|---|---|---|---|
| රු. 15,000/= | රු. 40,000/= | රු. 30,000/= | රු. 30,000/= |

- **පළමු වාරිකය හා ලියාපදිංචි ගාස්තු පාඨමාලාවට ලියාපදිංචි වීමේදී ගෙවීම් කළ යුතුය. උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර දෙවන වාරික හා තෙවන වාරික ගෙවීම් සම්පූර්ණ කළ යුතුය. ඒ පිළිබඳ විස්තර www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය හරහා පමණක් දැනුම් දෙනු ලැබේ.**

## 4.8. පාඨමාලා ගාස්තු

උපාධි I, උපාධි II හා උපාධි III පරීක්ෂණයන්ට වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය. ඊට අදාළ ගාස්තු හා අයදුම්පත් **www.external.sjp.ac.lk** යන අපගේ වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ. **උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ඉහත සියලුම (ලියාපදිංචි හා සියලු වාරික 1,2,3) ගාස්තු ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ.**

(i) **ප්‍රථමවරට පෙනී සිටින සිසුන් සඳහා**

උපාධි I පරීක්ෂණ ගාස්තු රු. 10,000/=

උපාධි II පරීක්ෂණ ගාස්තු රු. 12,000/=

උපාධි III පරීක්ෂණ ගාස්තු රු. 15,000/=

(ii) **පුනර් අපේක්ෂකයන් සඳහා**

| උපාධි I **පුනර් පරීක්ෂණ ගාස්තු** | උපාධි II **පුනර් පරීක්ෂණ ගාස්තු** | උපාධි III **පුනර් පරීක්ෂණ ගාස්තු** |
|---|---|---|
| එක් විෂයක් සඳහා රු. 5,000/= | එක් විෂයක් සඳහා රු. 5,000/= | එක් විෂයක් සඳහා රු. 5,000/= |
| විෂයන් 02ක් සඳහා රු. 7,000/= | විෂයන් 02ක් සඳහා රු. 7,000/= | විෂයන් 02ක් සඳහා රු. 7,000/= |
| විෂයන් 03ක් සඳහා රු. 9,000/= | විෂයන් 03ක් සඳහා රු. 9,000/= | විෂයන් 03ක් සඳහා රු. 9,000/= |
| විෂයන් 04ක් සඳහා රු. 11,000/= | විෂයන් 04ක් සඳහා රු. 11,000/= | විෂයන් 04ක් සඳහා රු. 11,000/= |
| විෂයන් 05ක් හෝ ඊට වැඩි රු. 13,000/= | විෂයන් 05ක් සඳහා රු. 13,000/= | විෂයන් 05ක් සඳහා රු. 13,000/= |
| | විෂයන් 06ක් සඳහා රු. 15,000/= | විෂයන් 06ක් සඳහා රු. 15,000/= |

වසර තුනෙන් පසු ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තු රු. 5,000/=

## 4.9. ඇගයීම

සෑම උපාධි කොටසක් සඳහාම අධ්‍යයන වර්ෂය අවසානයේදී අවසාන පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පරීක්ෂණ කාලය පැය තුනකි.

## 4.10. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම්

මෙම පාඨමාලාවට ලියාපදිංචි වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ සහ අවශ්‍ය අවස්ථාවන්හිදි විශේෂ වැඩමුළු සංවිධානය කිරීමට රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයේ මෙහෙයවීම යටතේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය කටයුතු කරනු ඇත.

## 4.11. විෂයමාලා විස්තරය

### උපාධි I කොටස

#### (i) MEX 1501 – කළමනාකරණ ක්‍රියාවලිය හා කාර්යාල කළමනාකරණය

රාජ්‍ය කළමනාකරණ උපාධිධාරීන් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ ආයතනවල සේවාවල නියුක්ත වනු ඇත. ඒ අනුව වෙනස් වන පරිසරයට සහ අභියෝගවලට මුහුණ දීමට සිසුන්ට අවශ්‍ය වන කළමනාකරණ දැනුම සහ කුසලතා ලබා දීම මෙම පාඨමාලාව මඟින් සිදුවේ.

#### (ii) MEX 1502 - දේශපාලන විද්‍යාව

දේශපාලනය පුද්ගලයන් කෙරෙහිත්, සමාජ සංවිධාන කෙරෙහිත්, ඍජු බලපෑමක් ඇති කරන තීරණාත්මක සාධකයකි. එබැවින් පුද්ගලයින්ටත් විවිධ සංවිධානවලටත් දේශපාලනය පිළිබඳ දැනුම ඉතාමත්ම ප්‍රයෝජනවත්ය. කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍ර තුළ කටයුතු කිරීමේදී ද දේශපාලන පරිසරය පිළිබඳ පුළුල් අවබෝධයක් පැවතීම අවශ්‍ය වේ. කළමනාකරුවෙකුගේ හා පරිපාලකයෙකුගේ හැසිරීමට බලපාන විවිධ දේශපාලනමය කරුණු පිළිබඳ විද්‍යාත්මක දැනුමක් හා අවබෝධයක් ලබා දීම පිණිස මෙම පාඨමාලා ඒකකය සැලසුම්කර තිබේ.

#### (iii) MEX 1503 – සූක්ෂම ආර්ථික විද්‍යාව

සූක්ෂම ආර්ථික විද්‍යාව මූලික වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ ආර්ථිකය සැදුම්ලත් තනි ඒකකයක ආර්ථික හැසිරීමයි. ආයතනයක් ලාභ ලැබීම හෝ සමාජ සුභසාධනය පෙරදැරිකරගෙන ක්‍රියාත්මක වුවද සූක්ෂම ආර්ථික විද්‍යාව ඒ සෑම ආයතනයකටම තම සීමිත සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට මඟ පෙන්වීමක් කරනු ලබයි. මෙම පාඨමාලාව සැලසුම් කර ඇත්තේ සූක්ෂම ආර්ථික විද්‍යා මූලධර්ම හඳුන්වාදීමටත් එම මූලධර්ම විවිධ තත්ත්වයන් යටතේ ඵලදායී තීරණ ගැනීම සඳහා භාවිතා කළ හැකි ආකාරය පෙන්වා දීමටත්ය.

#### (iv) MEX 1504 – මූල්‍ය ගිණුම්කරණය

සංවිධානයේ ප්‍රධාන තොරතුරු පද්ධතියට අවශ්‍ය ගිණුම්කරණ තොරතුරු අවබෝධ කර ගැනීම සහ සැපයීම පහසු කරලීම මෙම විෂයෙන් අරමුණු කරනු ලැබේ. මූල්‍ය ගිණුම්කරණ තොරතුරු භාවිතයෙන් දැනුවත් තීරණ ගැනීමට ද මෙම විෂය උපකාර වේ. ගිණුම්කරණ පරිසරය, ගිණුම්කරණ ක්‍රියාවලිය, සීමිත සමාගම්, සමූහ සමාගම් ඇතුළු ආර්ථික ඒකකයනගේ මූල්‍ය ගිණුම් ප්‍රකාශන සකස් කිරීම සහ තෝරාගත් ගිණුම්කරණ ප්‍රමිත කිහිපයකට අයදුම්කරුවන් යොමු කිරීම ප්‍රධාන වශයෙන්ම පාඨමාලාවෙන් අපේක්ෂා කරනු ලැබේ.

### (v) MEX 1505 - තොරතුරු තාක්‍ෂණය හැඳින්වීම

මෙම විෂය මගින් පරිගණක ආශ්‍රිත තොරතුරු, කළමනාකරණය සම්බන්ධයෙන් මූලික අවබෝධයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. එසේම වෙනස් වන වාණිජ ලෝකයේ තරගකාරි ව්‍යාපාරික කටයුතු සඳහා තොරතුරු තාක්‍ෂණය යොදා ගන්නා ආකාර පිළිබඳ මූලික අවබෝධයක් මෙමගින් ලබා දේ.

### (vi) MEX 1506 - ගණිතය හා සංඛ්‍යානය

මෙම පාඨමාලා ඒකකය ප්‍රධාන වශයෙන් ගණිතය හා සංඛ්‍යානය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර පළමු කොටසින් සිසුනට කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ගැටළුවලදී නිවැරදි තීරණ ගැනීමට සහ මෙම පාඨමාලාව සාර්ථකව නිමකිරීමට අවශ්‍ය වන ගණිතමය දැනුම ලබාදීමට බලාපොරොත්තු වන අතර දෙවන කොටසින් විශ්ලේෂණාත්මකව තීරණ ගැනීමට අවශ්‍ය වන සංඛ්‍යානමය දැනුම ලබාදීමට බලාපොරොත්තු වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් කළමනාකරණයේ දී හා තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන සංඛ්‍යන ශිල්ප ක්‍රම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීමට උත්සහ දරනු ලබයි.

### (vii) MEX 1007 – Compulsory English

This is a non-credit elementary course on professional communication in English, commencing at a fairly basic level and touching upon the fundamentals of language. A pre-intermediate level of language proficiency would be adequate for a student to enroll in the course. This course seeks to develop all four language competencies in the areas of reading, writing, listening and speaking skills in relation to business communication. In addition, grammar and vocabulary are also extensively discussed.

## උපාධි II කොටස

### (i) MEX 2501- රාජ්‍ය පරිපාලන විද්‍යා න්‍යාය හා පරිචය

විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ දුර්වල පරිපාලන කාර්යඵල සඳහා තුඩුදෙන න්‍යාත්මක දැනුමේ අඩු බව නිසාවෙන් සමාජයට කළ හැකි වැදගත් දායකත්වයෙන් වැඩකරන බහුතර ජනතාව වලක්වා ඇත. ඒ අනුව, පරිපාලන කුසලතාවයක් වර්ධනයට අවශ්‍ය පරිසරය නිර්මාණය කරනු අතරතුරේදී, ක්ෂේත්‍රය තුළ පවතින මූලික සංකල්ප හා න්‍යායන් සහ ශ්‍රී ලංකා පරිපාලන පද්ධතිය තුළට ඒවායේ යෙදවීම් හඳුන්වා දීම සඳහා

මෙම රාජ්‍ය පරිපාලනය පිළිබඳ මූලික විෂය සකස් කර ඇත. එම නිසාවෙන්, මෙම විෂය එම හිඟය පියවීමට පිටුවහලක් වන බවත් සහ ආණ්ඩුවේ ඕනෑම පරිපාලන ඛණ්ඩයකට ඉතා උසස් ලෙස දායකත්වය ලබා දිය හැකි ශාස්ත්‍රීය වශයෙන් පරිණත වූ පුද්ගලයින් බිහි කිරීම උදෙසා මෙම විෂය පිටුවහල් වනු ඇත.

## (ii) MEX 2502 (A) - සංවිධාන චර්යාව

ඕනෑම සංවිධානයක අගය එකතු කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ මානව සම්පතයි. සංවිධාන චර්යාව ඕනෑම ආයතනයක සේවක හෝ සේව්‍ය වන මානව සම්පත හැදෑරීමේ හා අවබෝධ කර ගැනීමෙහිලා පරම වූ අවස්ථාවක් උදා කර දෙයි. චර්යා විද්‍යාත්මක පර්යාලෝකයෙන් එය ලබා දීම විශේෂයි. ඒ තුළින් සංකීර්ණ මානව චර්යාව ක්‍රමානුකූලව හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර එම ප්‍රතිඵලයක් වශයෙන් සංවිධානවල මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායක ලෙස කළමනාකරණය කිරීමට අවස්ථාව උදා වේ. මෙම විෂයෙහි අන්තර්ගතය අවධානය යොමු කරනුයේ පුද්ගල, කණ්ඩායම් හා සංවිධාන මට්ටමින් මානව චර්යාව හැදෑරීමටයි. අන්තර්ගත වන ප්‍රධාන මාතෘකා වනුයේ විෂය හැඳින්වීම, පුද්ගල විශේෂතා, නායකත්වය, අභිප්‍රේරණය, සන්නිවේදනය, අධිකාරය, බලය හා බලපෑම් කණ්ඩායම් චර්යාව සංවිධාන වෙනස්වීමේ හා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය යනාදියයි. විෂයය හැදෑරීම තුළින් ශිෂ්‍යයන්ට විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික පරිසරයට අදාළ වන සේ සංවිධාන චර්යාව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික අවබෝධයක් හිමි වනු ඇත.

## MEX 2502 (B) - සමාජ විද්‍යාව

මෙම සමාජ විද්‍යාව පිළිබඳ මූලික විෂයය මිනිසාගේ සමාජ ජීවිතය විවරණය කරමින් මානව සමාජය පිළිබඳ දැනීමක් ලබා දෙනු ඇත. සමාජ අන්තර් ක්‍රියාකාරිත්වය ප්‍රධාන මාතෘකාව වශයෙන් තබා ගනිමින් හා රාජ්‍ය අංශයේ සංවිධාන පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සමාජ ව්‍යූහය හා සමාජ ක්‍රියාවලි සවිස්තර විග්‍රහයකට ලක් කෙරෙයි. ඒවා තුළින් තමාව හා සමාජයේ අන් අයව මනාව අවබෝධ කර ගැනීමේ හැකියාවන් ශිෂ්‍යයන් තුළ දියුණු වනු ඇත. මෙම විෂය තුළින් වර්තමාන සංකීර්ණ සමාජ සංස්කෘතික පරිසරයට ගැලපෙන පරිදි ශිෂ්‍යයින්ගේ තාර්කික චින්තනය, විනිශ්චය, ගැටලු විසඳීම හා ගැටුම් කළමනාකරණය කිරීම ආදී කෞශල්‍යයන් ශක්තිමත් කෙරේ.

මෙම ප්‍රධාන අන්තර්ගතයන් වනුයේ සමාජ විද්‍යාව හැඳින්වීම, සමාජානුයෝජනය හා පෞරුෂත්වය, සංස්කෘතික පවුල හා විවාහය, සංස්කෘතිය වැනි සමාජ සංස්ථාත් සමාජ ස්ථරායනය, සමාජ සංවිධාන වැනි සමාජ ක්‍රියාවලීන් සහ වඩාත් ප්‍රායෝගික වූ සමාජ වෙනස්වීම හා සංවර්ධනය යනාදී මාතෘකාවන්ය. මෙම විෂය හැදෑරීමෙන් පසු සමාජ ජීවිතය හා විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණයට අදාළ ගැටලු පිළිබඳ මනා අවබෝධයක් ශිෂ්‍යයින් තුළ ගොඩ නැගෙනු ඇත.

### (iii) MEX 2503 - සාර්ව ආර්ථික විද්‍යාව

මෙම පාඨමාලා ඒකකය මඟින් සමස්ථ ආර්ථික පද්ධතිය පිළිබඳව අවබෝධයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා මෙම පාඨමාලාව මඟින් සමස්ථ ඉල්ලුම, සමස්ථ සැපයුම ජාතික ආදායම පරිභෝජනය සහ ආයෝජනය පිළිබඳ අවධානය යොමු කෙරේ. මීට අමතරව පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්ති යොදා ගැනීමේදී රාජ්‍ය කාර්යභාරය සාකච්ඡා කෙරේ. මෙම පාඨමාලා ඒකකය මඟින් සාර්ව ආර්ථික නිමවුමට බලපාන සාධක වන ජාතික නිමවුමේ වර්ධනය, එහි කාලීන වෙනස්වීම්, සේවා වියුක්තිය සහ උද්ධමනය පිළිබඳ විග්‍රහ කෙරේ. තවදුරටත්, මෙය අනෙකුත් ආර්ථික විද්‍යා විෂයයන්ට සහ ආර්ථික විශ්ලේෂණ සඳහා පදනමකි.

### (iv) MEX 2504 - ව්‍යාපෘති කළමනාකරණය

රාජ්‍ය කළමනාකරණය ක්ෂේත්‍රයෙහි උපාධිධාරීහු බොහොමයක් රාජ්‍ය අංශයේ ව්‍යාපෘති කළමනාකරණ කටයුතුවල නිරතව සිටිති. රාජ්‍ය අංශය විසින් කරනු ලබන ව්‍යාපෘති කළමනාකරණය කිරීමේදී විශේෂත්වයන් කිහිපයක්ද සැලකිල්ලට භාජනය කළ යුතුවේ. ඒ අනුව මෙම විෂය මඟින් රාජ්‍ය අංශයෙහි ව්‍යාපෘති කළමනාකරුවෙකු සතුව තිබිය යුතු දැනුම, දක්ෂතා හා ආකල්ප සම්පාදනය කරනු ලබයි.

### (v) MEX 2505 - අලෙවි කළමනාකරණය

මෙම පාඨමාලා ඒකකය අලෙවි කළමනාකරණයේ මූලික න්‍යායාත්මක සංකල්ප සම්බන්ධයෙන් දැනුවත්භාවය සහ අවබෝධය ඇති කිරීම මඟින් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ අලෙවිකරණයේ ප්‍රායෝගික භාවිතය හඳුනා ගැනීමට සිසුන්ගේ දැනුම පුළුල් කිරීම අරමුණු කරගෙන ඇත. මෙය අලෙවිකරණය සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ඇති කිරීම සහ සංවිධානයන්හි අලෙවිකරණය සිදුකරන්නාවූ ඉතා වැදගත් භූමිකාව පිළිබඳ මනා රාමුවක් නියම කර ඇත. මෙම පාඨමාලාව තුළ අලෙවිකරණ නිර්වචනය සහ අලෙවි කළමනාකරණ ක්‍රියාවලිය, වෙළඳපල සහ පාරිභෝගිකයා අවබෝධ කර ගැනීම, අලෙවිකරණ අවස්ථා විශ්ලේෂණය, ඉලක්ක අලෙවිකරණ උපාය මාර්ග, අලෙවිකරණ වැඩසටහන් සංවර්ධනය සහ අලෙවි ප්‍රයත්නයන් කළමනාකරණය යන විෂය ක්ෂේත්‍ර ආවරණය කර ඇත.

### (vi) MEX 2506 - ව්‍යවස්ථා, පරිපාලන හා වාණිජ නීතිය

මෙම පාඨමාලා ඒකකය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, පරිපාලන නීතිය හා වාණිජ නීතය යන විෂය කොටස් තුනකින් සමන්විතය. මෙම පාඨමාලා ඒකකය රාජ්‍ය කළමනාකරණය සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ මූලික විෂය කොටසක් වන රාජ්‍ය කළමනාකරණයට අදාළ

මූලික නීතිමය පදනම සපයයි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ මෙම පාඨමාලා ඒකකය මගින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා නිදහසට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ හැඳින්වීමක් සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියේ මූලික කරුණු හඳුන්වා දෙයි. පරිපාලන නීතිය අධ්‍යයනයේදී පරිපාලන නීතියේ මූලික මූලධර්ම ආවරණය වන, පරිපාලන නීතියේ ස්වභාවය, බලාතික්‍රම නීතිය, ස්වභාව යුක්ති මූලධර්ම, පරිපාලන පර්ශද කරනු ලැබේ. වාණිජ නීතියේ මූලධර්ම හඳුනා ගැනීම හා ශ්‍රී ලංකාවට අදාළව ඒවායේ භාවිතය ගැන දැනුම, මෙම විෂය ඒකකයෙන් සිසුන්ට ලබාදෙන දැනුම වඩා වැඩි වටිනාකමක් එකතු කරයි.

## උපාධි III කොටස

### (i) MEX 3501 - රාජ්‍ය ප්‍රතිපත්ති

මෙම පාඨමාලාව මගින් රාජ්‍ය ප්‍රතිපත්ති න්‍යාය හා ප්‍රායෝගිකත්වය පිළිබඳ හැඳින්වීමක් ලබා දේ. එසේම රජයේ සැලසුම් හා වැඩසටහන්වල තාර්කිකභාවය හා ඵලදායීතාව වැඩි කිරීම සඳහා එම රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කරන්නේ කෙසේ ද ඒවා ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද සහ රාජ්‍ය ප්‍රතිපත්ති අගයන්නේ කෙසේ ද යන්න පිළිබඳව පැහැදිලි කරයි.

### (ii) MEX 3502 - සංවර්ධන පරිපාලනය

රාජ්‍ය කළමනාකරණ උපාධිධාරීන් බහුතරයක් රාජ්‍ය අංශයට සම්බන්ධ ආයතනවල සේවාවල නියුක්ත වනු ඇත. එබැවින්, දියුණු වෙමින් පවතින රටවල රාජ්‍ය අංශයේ සේවයේ නියුතුවන්නන්ට අවශ්‍ය වන සංවර්ධන පරිපාලනය පිළිබඳ විෂය දැනුම ලබාදීම මෙම පාඨමාලාවෙන් බලාපොරොත්තු වේ. නිලතන්ත්‍රයේ පැවරෙන නව කාර්යභාරයන් සාම්ප්‍රදායික රාජ්‍ය පරිපාලනයේ පැහැදිලි කළ නොහැකි වේ. රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ ධාරිතාව ප්‍රමාණවත් නොවන අතර පරිපාලන ක්‍රමය තවදුරටත් දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. එබැවින් රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ ඇති වන වෙනස්කම් පිළිබඳව අධ්‍යයන කරනු ලබන සංවර්ධන පරිපාලන විෂය හැදෑරීම අවශ්‍ය වේ.

### (iii) MEX 3503 - රාජ්‍ය මූල්‍යය

රාජ්‍ය මූල්‍යය විෂය මගින් ආර්ථිකයක කටයුතු කෙරෙහි රජයේ මැදිහත් වීම විස්තර කරයි. එය සිදු කරනුයේ වෙළඳපොලවල් අසාර්ථක වනුයේ ඇයි යන්න පිළිබඳව අවබෝධයක් ලබා දෙමිනි. තවදුරටත්, මෙම විෂය රජයක් අසාර්ථක වීමේ හැකියාව සහ අදාළ වන මූලාශ්‍ර සාකච්ඡා කරයි.

රාජ්‍ය කළමනාකරණයට සම්බන්ධ බොහොමයක් උපාධිධාරීහු රාජ්‍ය මූල්‍යයට සම්බන්ධ විවිධ වූ ක්‍රියාකාරකම්වල සේවයේ නිරත වෙති. එම ක්‍රියාකාරීත්වයන් අතර රාජ්‍ය වියදම් ව්‍යාපෘති සැලසුම්කරණය, බදු ක්‍රම සකස් කිරීම සහ රාජ්‍ය අයවැයකරණය ආදිය ඇතුළත් වේ. ඒ අනුව මෙම විෂය මඟින් එම අරමුණු ඉටු කර ගැනීම සඳහා සවිමත් වූ අවබෝධයක් සපයා දෙයි.

## (iv) MEX 3504 - සංවර්ධන ආර්ථික විද්‍යාව

සංවර්ධන ආර්ථික විද්‍යාව වූ කලී ඉතා වැදගත් විෂය ක්ෂේත්‍රයකි. හුදෙක් එය න්‍යායාත්මක විෂයයක්ම නොව ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය හැදෑරීම මූලික කර ගත් විෂයයකි. ආර්ථික සංවර්ධනය යනු සමස්ථ මිනිසාගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම සඳහා පහසුකම් සපයන්නා වූ ව්‍යුහාත්මක වෙනස්වීම්වලට ලක්වන්නා වූ ක්‍රියාවලියකි. එහෙයින්, ආර්ථික වර්ධනයේ ඵල බෙදා හැරීම, රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලුවකි. මෙම පාඨමාලාව මඟින් වර්තමාන රටවල් මුහුණපාන ආර්ථික සංවර්ධන ගැටලු පිළිබඳ හැඳින්වීමක් සිසුන්ට ලබා දීම අරමුණු කර ගත් අතර, තවදුරටත් එම ගැටලු විසඳීමේ මූලික කුසලතා වර්ධනය තුලින් එහිලා ශිෂ්‍යයාගේ දායකත්වය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

## (v) MEX 3505 - මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් පිවිසුම උපයෝගී කර ගනිමින් වෘත්තීය මට්ටමින් සේවක කළමනාකරණය කිරීමේ දැනුම ලබා දීම මෙහි අරමුණ වේ. මානව සම්පත් සැලසුම්කරණය, මාණ්ඩලීකරණය, රැකියා සැලසුම් කිරීම, පුහුණු කිරීම හා වර්ධනය, සේවක ක්‍රියාකාරකම් ඇගයීම, ප්‍රතිලාභ ලබා දීම, කාර්මික සම්බන්ධතා, වෘත්තිය සමිති හා කම්කරු නීතිය මෙහි අඩංගු ප්‍රධාන මාතෘකාවන් අතර වේ.

## (vi) MEX 3506 - මූල්‍ය කළමනාකරණය

මූල්‍ය කළමනාකරණය පිළිබඳ මෙම මූලික විෂය ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණය පිළිබඳ මූලික දැනුම වැඩි දියුණු කිරීම උදෙසා සකස් කර ඇත. ඒ අනුව, ක්ෂේත්‍රය තුළ පවතින මූලික සංකල්ප හා න්‍යායන් සාකච්ඡා කරනු ඇත. එම නිසාවෙන්, මෙම විෂය ව්‍යාපාරයකි. මූල්‍ය කළමනාකරණයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික පැතිකඩයන් අවබෝධය උදෙසා පිටුවහලක් වනු ඇත.

## 4.12. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධියේ විභාග නීතිරීති සහ රෙගුලාසි

මෙම රෙගුලාසි මගින් මෙකී උපාධියට අදාළ උපමානයන් හා අනෙකුත් කොන්දේසි සපයනු ලබයි. රෙගුලාසි සම්බන්ධ ඕනෑම අර්ථකථනයක් වේ නම්, සනාතන සභාව වෙත ඉදිරිපත් කරනු ඇති අතර, සනාතන සභාවේ තීරණය අවසාන තීරණය වේ. විභාග නීතිරීති සම්බන්ධ අත්පොත ඔබ වෙත ලබා දෙනු ඇත.

### a) සම්භාර අගය (Credits)

අධ්‍යයන නිපුණතාව ගණනය කිරීමේ මිනුම් දණ්ඩ 'සම්භාර අගය' යනුවෙන් හැඳින්වේ. සම්භාර අගය එකක් යනු අධ්‍යයන පැය පහළොව (15) කි. එකී පදනම මත, එක් එක් පාඨමාලාවක් සඳහා ලබාදෙන සම්භාර අගයයන් සංඛ්‍යාව පහත 01 වගුවෙහි සඳහන් වේ.

**වගුව 01 : අධ්‍යයන හෝරා සහ සම්භාර අගය අතර සබඳතාවය**

| සම්භාර අගය | අධ්‍යයන පැය ගණන |
|---|---|
| 1 | 15 |
| 2 | 30 |
| 3 | 45 |
| 4 | 60 |
| 5 | 75 |

### b) ශිෂ්‍යයාගේ අධ්‍යයන කාර්යභාරය

එක් අධ්‍යයන වර්ෂයක් සඳහා වන සම්භාර පැය ගණන 30 ක් වේ. සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා අදාළ වන මුළු සම්භාර පැය ගණන 90කි.

## c) ශ්‍රේණිගත කිරීමේ මිනුම්

කාණ්ඩ 12ක විසිරීම මත සිසුවාගේ කාර්යසාධනය ශ්‍රේණිගත කෙරෙනු ඇත. A+ (විශේෂිත) සිට E (අසමත්) දක්වා පරාසයක් තුළ එම ශ්‍රේණිගත කිරීම සිදු කෙරේ. ශ්‍රේණිගත කිරීමේ මිනුම් පහත 02 වගුවෙහි දක්වා ඇත. ‘MC’ යනුවෙන් දක්වා ඇත්තේ වෛද්‍ය හේතූන් මත ඉවත්වීමය.

| ලකුණු පරාසයන් | ශ්‍රේණිය | එක් සම්භාර පැයක් සඳහා වන ශ්‍රේණි ලකුණු |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E | 0.00 |

වගුව 02 : ශ්‍රේණිගත කිරීමේ මිනුම්

## d) ශ්‍රේණිගත සාමාන්‍ය අගය ගණනය කිරීම සඳහා උපදෙස්

ශ්‍රේණිගත සාමාන්‍ය අගය {Grade Point Average (GPA)} යනු සිසුවකුගේ සමස්ත අධ්‍යාපන ජයග්‍රහණයන් පෙන්නුම් කිරීමේ සංඛ්‍යාත්මක ක්‍රමවේදයයි. GPA යනු, සිසුවාට ‘අක්ෂර’ ශ්‍රේණියක් ලැබෙන මුලු ශ්‍රේණිගත ලකුණු බෙදීමෙන් ලබාගන්නා ඵලයයි. GPA ගණනය කිරීමේදී, ස්ථාන දෙකකට වඩා ඇති දශමස්ථාන කපා හරින අතර, රවුම් සංඛ්‍යාවක් කරනු ලැබේ.

GPA ගණනය කිරීමේ සූත්‍රය පහත පරිදි වේ.

$$GPA = \frac{\sum_{i=1}^{N} (Credits)_i \ X \ (Grade \ points \ Per \ Hour)_i}{\sum_{i=1}^{N} (Credits)_i}$$

i = පාඨමාලා අංකය, සහ N = සැලකිල්ලට ගත් පාඨමාලා සංඛ්‍යාව

උපරිම වශයෙන් ලබාගත හැකි GPA මට්ටම 4.00ක ට සීමාවන අතර, අවමය 0කි. උපාධි පාඨමාලාවේ පළමු වර්ෂාර්ධයේ දී මනඃකල්පිත සිසුවකුගේ GPA මට්ටම ගණනය කිරීම පහත 03 වගුවෙහි දැක්වේ.

**වගුව 03 : GPA මට්ටම ගණනය කිරීමේ නිදර්ශනය**

| පාඨමාලා කේතය | ලබාගත් ශ්‍රේණි අක්ෂරය | සම්භාර පැය ගණන | පැයකට ශ්‍රේණිගත ලකුණු | ලබාගත් ශ්‍රේණිගත ලකුණු අගය = සම්භාර පැය ගණන × පැයකට ලබාගත් ශ්‍රේණිගත ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| MEX 1501 | A+ | 5 | 4.00 | 20.00 |
| MEX 1502 | A- | 5 | 3.70 | 18.50 |
| MEX 1503 | B+ | 5 | 3.30 | 16.50 |
| MEX 1504 | C+ | 5 | 2.30 | 11.50 |
| MEX 1505 | D | 5 | 1.00 | 05.00 |
| MEX 1506 | A | 5 | 4.00 | 20.00 |
| **Total** | | **30** | | **91.50** |

GPA = $\frac{\text{ලබාගත් මුළු ශ්‍රේණිගත ලකුණු අගය}}{\text{සම්පූර්ණ සම්භාර පැය ගණන}} = \frac{91.5}{30} = 3.05$*

*** GPA** ගණනය කිරීමේදී දෙකකට වැඩි දශමස්ථාන කෙටි කර ඇත. පූර්ණ සංඛ්‍යාවන් ලෙස දක්වා නොමැත.

## 4.13. උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලබාදෙන උපරිම කාලසීමාව

උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවසර දෙනු ලබන උපරිම කාලසීමාව වන්නේ ලියාපදිංචි වූ වර්ෂයේ සිට නොකඩවා අධ්‍යන **වසර හත (07)ක කාලයකි**. මෙම කාලසීමාවෙන් පසුව කිසිඳු හේතුවක් නිසා කාලය දීර්ඝ කිරීමට අවසර ලබා දෙනු නොලැබේ. මෙම කාලසීමාව ඇතුළත කිසියම් සිසුවකු සිය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුට හෝ ඇයට නව අයදුම්කරුවකු වශයෙන් පාඨමාලාව සඳහා යලි ලියාපදිංචි විය හැකි අතර, පෙර හැදෑරීමේ දී ලබාගත් ප්‍රතිඵල එමගින් ශුන්‍ය හා බලරහිත වශයෙන් සැලකෙනු ඇත.

### a) එක් පාඨමාලාවක් සඳහා උත්සහ කළ හැකි වාර ගණන

අධ්‍යයන වර්ෂ හතක (07) කාලය තුළ උපාධි I කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි හත් වරක් (07), උපාධි II කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි හය වරක් (06), උපාධි III කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි පස් වරක් (05) පෙනී සිටීමේ අවස්ථාව උපාධි අපේක්ෂකයන්ට හිමි වේ.

### b) සම්භාර අගය සහිත පාඨමාලාවක් සමත්වීම හෝ අසමත්වීම

අදාළ පාඨමාලාව සඳහා ඔහු/ ඇය ලබාගත් සමස්ත සාමාන්‍ය 40%ක් හෝ ඊට ඉහළ නම් ( C සාමාර්ථ්‍යය හෝ ඊට ඉහළ සාමාර්ථ), එකී අයදුම්කරු එම සම්භාර අගය සහිත පාඨමාලාව සමත් වූ බවට සැලකෙනු ඇත.

### c) සම්භාර අගය රහිත පාඨමාලාව

අදාළ පාඨමාලාව සඳහා ඔහු/ ඇය 'සමත් ' ශ්‍රේණියක් ලබාගන්නේ නම් ( C සාමාර්ථ්‍යයක්) , එකී අයදුම්කරු එම සම්භාර අගය රහිත පාඨමාලාව සමත් වූ බවට සැලකෙනු ඇත.

## d) සම්භාර අගය සහිත පාඨමාලාවක් නැවත හැදෑරීම

- 'D' හෝ 'E' ශ්‍රේණියක් ලබාගන්නා සිසුවකු, පාඨමාලාව නැවත හැදෑරීම සඳහා ඊළඟ අධ්‍යයන වර්ෂයේ දී එකී පාඨමාලාව සඳහා ලියාපදිංචි වී එකී පාඨමාලාව සම්පූර්ණ කළ යුතු ය.
- 'C-' හෝ 'D+' ශ්‍රේණියක් ලබාගන්නා සිසුවකු හට, ඊළඟ අධ්‍යයන වර්ෂයේ දී එකී පාඨමාලාව සඳහා ලියාපදිංචි වී එකී පාඨමාලාව සම්පූර්ණ කළ හැකි ය.
- පරීක්ෂණයකට නැවත පෙනී සිටින අයදුම්කරුවකු, එම පරීක්ෂණය සඳහා තමා ලබාගන්නා ලකුණු සංඛ්‍යාව කුමක් වුවත්, ලබාදෙන උපරිම ලකුණු සංඛ්‍යාව 40%කි. නැවත හදාරනු ලබන පාඨමාලාවක් සඳහා ලබාදෙන උපරිම ශ්‍රේණිය 'C' වේ.
- නැවත උත්සහ කිරීමේ දී සිසුවා ලබාගන්නා ශ්‍රේණිය පෙර උත්සහයේ දී ලබාගත් ශ්‍රේණියට පහළ ශ්‍රේණියක් වුවහොත් ලබා ඇති, වඩා ඉහළ ශ්‍රේණිය බලපැවැත්වෙනු ඇත.
- සාධාරණ හේතුවකින් තොර ව අදාළ අධ්‍යයන වර්ෂයේ දී විභාගයට පෙනී සිටීමට අපොහොසත් වන සිසුවකු නැවත හදාරන සිසුවකු වශයෙන් සැලකෙනු ඇත.

## e) සම්භාර අගය රහිත පාඨමාලාවක් නැවත හැදෑරීම

සම්භාර අගය රහිත පාඨමාලාවක් අසමත් වන සිසුවකු හට, ඊළඟ අධ්‍යයන වර්ෂයක දී ඒ සඳහා ලියාපදිංචි වී එම පාඨමාලාව නැවත හැදෑරිය හැකි ය.

## f) විභාගයක් සමත්වීම

අයදුම්කරුවකු අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් (GPA අගය) 2.00ට නොඅඩු මට්ටමක් ලබාගත් විට හා එම අධ්‍යයන වර්ෂයේදී ලබාගත් දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව එකකට නොවැඩි වූ විට සහ අසමත් ශ්‍රේණි ('D' හෝ 'E') නොමැති විට සහ සම්භාර අගය රහිත පාඨමාලාව සමත් වූ විට ඔහු/ ඇය එම විභාගය සමත් වූ ලෙසට සලකනු ලබයි.

## 4.14. විභාග ප්‍රතිඵල

ඉහත 02 වගුවෙහි දක්වා ඇති පරිදි, එක් එක් පාඨමාලාව සඳහා ලබා ඇති ශ්‍රේණිය (Grade) සහ GPA මට්ටම අයදුම්කරු වෙත දන්වනු ඇත. එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව එක් එක් අයදුම්කරු වෙත ප්‍රතිඵල පත්‍රය ලබාදෙනු ඇත.

### a) වෛද්‍ය හේතූන් මත ඉවත්වීම

වලංගු ලිඛිත සාධක මත වෛද්‍ය හේතූන් සම්බන්ධයෙන් (ඇමුණුම 3) සිසුවකුට උපාධි පාඨමාලාවක් සඳහා වන විභාගයකට පෙනී නොසිට ඉවත්විය හැකි ය. එවැනි අවස්ථාවක දී ‘MC’ සංකේතය සිසුවාට ලැබෙනු ඇත. වෛද්‍ය හේතූන් මත ඉවත්වීමට ඉල්ලා සිටීමේ දී ඒ සම්බන්ධයෙන් වන විශ්වවිද්‍යාල උපදෙස් සිසුවා විසින් අනුගමනය කළ යුතු අතර, ඊළඟ වර්ෂයේ දී සිසුවා එකී පාඨමාලාව/ පාඨමාලා සඳහා පෙනී සිටිය යුතු ය.

### b) පරීක්ෂණ සඳහා නැවත යොමු කරවීම

ඉහත 4.13 කොටසේ (f) යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වූ අයදුම්කරුවකු අදාළ විභාගය සඳහා නැවත යොමු කරවනු ඇත. නැවත යොමුකරවන ලද (Reffered) ශිෂ්‍යයෙක්, අසමත් වූ සම්භාර අගය සහිත (සියලු ‘D’ සහ ‘E’ ශ්‍රේණි) සහ සම්භාර අගය රහිත (අසමත්) විෂයයන් හට ඉහත 4.13 (d) සහ (e) කොටස්වල දක්වා ඇති නියමයන්ට අනුකූලව ඉදිරිපත් වී එම විෂයන් සමත් විය යුතුය.

## 4.15. උපාධියක් සම්පූර්ණ කිරීම : උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන්

උපාධියක් ලැබීමට, සිසුවකු විසින් පහත කරුණු සියල්ල සපුරාලිය යුතුවේ.

- → සම්භාර පැය 90ක් සම්පූර්ණ කර තිබීම,
- → එක් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් 2.00ට නොඅඩු GPA මට්ටමක් ලබා තිබීම,

- → සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා 2.00ක අවම සමස්ත GPA මට්ටමක් ලබා තිබීම,
- → අසමත් ශ්‍රේණි ('D' සහ 'E') සහ AB නොතිබීම,
- → එක් අධ්‍යයන වර්ෂයක් සඳහා දුර්වල ශ්‍රේණි ('C-' සහ 'D+') එකකට නොවැඩිවීම,
- → සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා වන දුර්වල ශ්‍රේණි සංඛ්‍යාව 03 නොඉක්මවීම,
- → සම්භාර රහිත පාඨමාලාව සඳහා 'සමත්' ශ්‍රේණියක් ලබා තිබීම,
- → ප්‍රථමයෙන් ම විශ්වවිද්‍යාලයට බැඳුණු අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් වසර හත (07)ක් ඇතුළත ඉහත දක්වා ඇති සියලු අවශ්‍යතාවන් සපුරා තිබීම.

## 5. පන්ති සාමාර්ථ්‍ය පිරිනැමීම

### a) පළමු පෙළ පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා

පළමු පෙළ පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සියල්ල සපුරාලිය යුතු වේ :

- → සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.7-4.00 පරාසය තුළ සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.
- → උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'A+' හෝ 'A' ශ්‍රේණි ලබා තිබිය යුතුය.
- → 'C' ශ්‍රේණියට පහළ ශ්‍රේණි සිසුවා විසින් ලබා නොතිබිය යුතුය.
- → සම්භාර රහිත පාඨමාලාව සඳහා සිසුවා විසින් 'සමත්' ශ්‍රේණිය ලබා තිබිය යුතුය.
- → අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

### b) දෙවන පෙළ (ඉහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා

දෙවන පෙළ (ඉහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සියල්ල සපුරාලිය යුතු වේ:

- → සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.30 හෝ ඊට වැඩි සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.
- → උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'A-' හෝ ඊට වැඩියෙන් ලබා තිබිය යුතුය.

- → උපාධියට අදාළ සම්පූර්ණ කාලයේ දී සිසුවා විසින් ලබා ඇති දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව දෙකකට නොවැඩි විය යුතුය.
- → සම්භාර අගය රහිත පාඨමාලාව සඳහා සිසුවා විසින් 'සමත්' ශ්‍රේණිය ලබා තිබිය යුතුය.
- → අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

**c) දෙවන පෙළ (පහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා**

දෙවන පෙළ (පහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සපුරාලිය යුතු වේ :

- → සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.00 හෝ ඊට වැඩි සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.
- → උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'B+'හෝ ඊට වැඩියෙන් ලබා තිබිය යුතුය.
- → උපාධියට අදාළ සම්පූර්ණ කාලයේ දී සිසුවා විසින් ලබා ඇති දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව දෙකකට නොවැඩි විය යුතුය.
- → සම්භාර රහිත පාඨමාලාව සඳහා සිසුවා විසින් 'සමත්' ශ්‍රේණිය ලබා තිබිය යුතුය.
- → අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

## d) උපාධිය වලංගු වන දිනය

යම් උපාධි අපේක්ෂකයෙකු පළමුවෙන් ලියාපදිංචි වු වර්ෂයේ සිට උපාධි I, II සහ III පරීක්ෂණ සඳහා ප්‍රථම වරට පෙනී සිටිමින් අනුපිළිවෙලින් සමත් වන්නේ නම් උපාධිය සඳහා වලංගු දිනය වන්නේ තුන්වන අධ්‍යයන වර්ෂයේ විභාග කාලච්ඡේදය අවසන් වන දිනට පසු දිනය (ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවන) වේ.

යම් උපාධි අපේක්ෂකයෙකු එක් අධ්‍යයන වර්ෂයක් හෝ පුනර් පරීක්ෂණයකට පෙනී සිට ඇත්නම් පුනර් අපේක්ෂකයන්ගේ උපාධිය වලංගු වන දිනය වන්නේ එක් එක් කැලැන්ඩර් වර්ෂයෙහි ජුනි 30 හෝ දෙසැම්බර් 31 (හෝ එම දිනය රජයේ නිවාඩු දිනයක් හෝ ඉරිදා දිනයක් වන්නේ නම් එදිනට පසුව එළඹෙන වැඩ කරන දිනය) වශයෙන් අදාල පරිදි ලබා දෙනු ලැබේ.

## e) පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය සඳහා කැමැත්තක් දක්වන සිසුන් විභාග ප්‍රතිඵල නිකුත් කර දින **14** ක් ඇතුළත ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. අදාල විස්තර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ www.external.sjp.ac.lk වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ.

## ඇමුණුම අංක 01

### ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට විශ්වවිද්‍යාල සනාතන සභාව පිළිගත් වෙනත් සුදුසුකම්

(a) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ සීමිත තරග විභාගයෙන් සමත් වී රජයේ පරිපාලන සේවයට ඇතුළත් වී සිටීම.

(b) ශ්‍රී ලංකා රජයේ ගණකාධිවරුන්ගේ සේවයට බඳවා ගැනීමේ තරග විභාගයෙන් සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී සිටීම.

(c) අධ්‍යාපන දෙපාර්තමේන්තු පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.

(d) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන විද්‍යාව පිළිබඳ දෑඅවුරුදු පාඨමාලාව සමත් වී තිබීම.

(e) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑඅවුරුදු සහතිකය.

(f) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ප්‍රථම හා ද්විතීයික වර්ෂ පරීක්ෂණවලින් සමත්ව තිබීම.

(g) ලන්ඩන් වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රයේ සාමාජිකත්වය ලබා තිබීම.

(h) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(j) ශ්‍රී ලංකාවේ හෝ එක්සත් රාජධානියේ ගණකාධිකරණ ශිල්පීය ආයතනය මඟින් පවත්වන විභාගයේ (AAT) සියලුම කොටස් සමත් වී තිබීම.

(k) ශ්‍රී ලංකා යුද්ධ, නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරිලත් ශ්‍රේණියක නිලධාරියෙකු වීම.

(l) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක හෝ ඊට ඉහළ නිලයක නිලධාරියෙකු වීම.

(m) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව සමත්ව තිබීම.

මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශයෙන් සිදු කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

**විමසීම් :**

සමායෝජක - රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය
දු.ක. - 011-2802006
වෙබ් අඩවිය : www.external.sjp.ac.lk

මෙම පාඨමාලාවේ අනෙකුත් සියලුම කාර්යයන් බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයෙන් සිදු කරනු ලැබේ.

## 5. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

### 5.1. හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධි පාඨමාලව පුරා දශක තුනකට අධික කාලයක් තිස්සේ දෙස් විදෙස් පිළිගැනීමට ලක්වූ වාණිජ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ප්‍රථම උපාධි පාඨමාලවකි. ශ්‍රී ලංකාවේ වාණිජවේදී උපාධිය සඳහා බාහිර අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම ප්‍රථමයෙන් ආරම්භ කරන ලද්දේ 1975 දී එවකට පැවති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ බාහිර විභාග මණ්ඩලය මගිනි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1979 වර්ෂයේ සිට පැරණි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ බාහිර විභාග, විශ්වවිද්‍යාල අතර විමධ්‍යගත කිරීම යටතේ වාණිජ විද්‍යා බාහිර විභාග පැවැත්වීම හා ඒ සඳහා බාහිර අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට (එවකට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපය) පැවරිණි. පසුව 1996 වර්ෂයේ සිට සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාව වෙනුවට විෂයන් 15කින් සමන්විත වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලව වාණිජ විද්‍යා අධ්‍යයනාංශය විසින් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන වාණිජවේදී බාහිර උපාධි පාඨමාලා අතර ප්‍රමුඛස්ථානය උසුලනු ලබන වාණිජවේදී උපාධිය කළමනාකරණ හා වාණිජ ක්ෂේත්‍රයේ ඕනෑම රැකියාවක් සඳහා අයදුම් කිරීමට පිළිගත් සුදුසුකමක් ලෙස සැලකේ. 2012 වසරේදී වාණිජවිද්‍යා අධ්‍යයනාංශය මගින් වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලව සංශෝධනය කරන ලදී. ඒ අනුව 2012 දී හඳුන්වා දුන් නව පාඨමාලාව අනිවාර්ය විෂයන් 18 කින් සහ (Non-credit) විෂයයකින් සමන්විත වේ.

ඉන් පසුව සමාජීය මෙන්ම විශේෂයෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ අවශ්‍යතාවයන් මත වාණිජවිද්‍යා අධ්‍යයනාංශය මගින් වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලව 2022 වසරේදී නැවතත් සංශෝධනය කරන ලදී. ඒ අනුව හඳුන්වා දුන් නව පාඨමාලාව අනිවාර්ය විෂයන් 20 කින් සමන්විත වන අතර 2023 අධ්‍යයන වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

## 5.2. ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයන් 03 ක් එක් වතාවකදී සමත්වීම.

හෝ

(ආ) වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධියට අදාළ පරීක්ෂණ සඳහා බාහිර අපේක්ෂකයන් ලෙස ලියාපදිංචි වීම පිණිස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් සුදුසුකම් සපුරා තිබීම. (ඇමුණුම අංක 2 - පිටු අංක 58)

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටීම.

හෝ

(ඇ) ඉහත සඳහන් සුදුසුකම්වලට හෝ අවශ්‍යතාවලට හෝ සමාන සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවිද්‍යා අධ්‍යයනාංශ බාහිර විභාග කමිටුව සහ සනාතන සභාවේ පිළිගත් සුදුසුකමක් ලබා සිටීම.

බාහිර අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සෑම අයදුම්කරුවකුම/ අයදුම්කාරියක්ම එකී අධ්‍යයන වර්ෂයේ ජනවාරි මස 01 වන දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

### a) ලියාපදිංචි කාලසීමාව

මෙම උපාධිය සඳහා අලුතින් ලියාපදිංචි වන අපේක්ෂකයෙකුගේ ලියාපදිංචි කාලසීමාව වර්ෂ තුනක් ඉක්මවූ පසු තවදුරටත් අවශ්‍ය වන්නේ නම් වසරින් වසර වර්ෂ 07ක් දක්වා ලියාපදිංචිය අලුත් කරවා ගත හැකිය. නියමිත කාලය ඇතුළත ලියාපදිංචිය දීර්ඝ කරවා ගැනීම සිසුන්ගේ වගකීමක් වන අතර, කාලය ඉක්මවා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. මුල් ලියාපදිංචියේ සිට ලියාපදිංචිය අලුත් කරවා ගතහැකි උපරිම කාලසීමාව වසර හතකි (07). කෙසේ වුවද අධ්‍යයන වර්ෂ තුනක් ඇතුළත උපාධිය සම්පූර්ණ කර නොගන්නා සිසුන් පන්ති සාමාර්ථ්‍ය ලැබීමට සුදුසුකම් නොලබයි. **වසර 07 ඉක්මවූ පසු කිසිම හේතුවක් නිසා ලියාපදිංචිය අළුත් නොකෙරේ.**

## b) වාර්ෂික බඳවා ගැනීම් හා තෝරා ගැනීමේ පටිපාටිය

වාර්ෂික බඳවාගනු ලබන සිසුන් ප්‍රමාණය සහ තෝරා ගැනීමේ ක්‍රමවේදය සෑම අධ්‍යයන වර්ෂයකදීම වාණිජ විද්‍යා අධ්‍යයනාංශය විසින් තීරණය කරනු ලැබේ.

## c) භාෂා මාධ්‍යය

වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය හැකිය. ඔබ විසින් වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී පාඨමාලා මාධ්‍ය තෝරා ගත යුතු වේ. ඉන් පසුව කිසිඳු හේතුවක් මත පාඨමාලාවේ මාධ්‍ය වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

## d) පාඨමාලා ගාස්තු

| ලියාපදිංචි ගාස්තු | පළමු වාරිකය | දෙවන වාරිකය | තෙවන වාරිකය |
|---|---|---|---|
| රු. 15,000/= | රු. 50,000/= | රු. 45,000/= | රු. 40,000/= |

- **පළමු වාරිකය හා ලියාපදිංචි ගාස්තු පාඨමාලාවට ලියාපදිංචි වීමේදී ගෙවීම් කළ යුතුය. උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර දෙවන වාරික හා තෙවන වාරික ගෙවීම් සම්පූර්ණ කළ යුතුය. ඒ පිළිබඳ විස්තර www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය හරහා පමණක් දැනුම් දෙනු ලැබේ.**

## e) පරීක්ෂණ ගාස්තු

උපාධි I, උපාධි II හා උපාධි III වසර පරීක්ෂණයන්ට වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය. ඊට අදාළ ගාස්තු හා අයදුම්පත්‍ර **www.external.sjp.ac.lk** යන අපගේ වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ. **උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ඉහත සියලුම (ලියාපදිංචි හා සියලු වාරික 1,2,3) ගාස්තු ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ.**

**(i) ප්‍රථමවරට පෙනී සිටින සිසුන් සඳහා**

උපාධි I **පරීක්ෂණ ගාස්තු** රු. 10,000/=

උපාධි II **පරීක්ෂණ ගාස්තු** රු. 12,000/=

උපාධි III **පරීක්ෂණ ගාස්තු** රු. 15,000/=

**(ii) පුනර් අපේක්ෂකයන් සඳහා**

| උපාධි I **පුනර් පරීක්ෂණ ගාස්තු** | උපාධි II **පුනර් පරීක්ෂණ ගාස්තු** | උපාධි III **පුනර් පරීක්ෂණ ගාස්තු** |
|---|---|---|
| එක් විෂයක් සඳහා රු. 5,000/= | එක් විෂයක් සඳහා රු. 5,000/= | එක් විෂයක් සඳහා රු. 5,000/= |
| විෂයන් 02ක් සඳහා රු. 7,000/= | විෂයන් 02ක් සඳහා රු. 7,000/= | විෂයන් 02ක් සඳහා රු. 7,000/= |
| විෂයන් 03ක් සඳහා රු. 9,000/= | විෂයන් 03ක් සඳහා රු. 9,000/= | විෂයන් 03ක් සඳහා රු. 9,000/= |
| විෂයන් 04ක් සඳහා රු. 11,000/= | විෂයන් 04ක් සඳහා රු. 11,000/= | විෂයන් 04ක් සඳහා රු. 11,000/= |
| විෂයන් 05ක් හෝ ඊට වැඩි රු. 13,000/= | විෂයන් 05ක් සඳහා රු. 13,000/= | විෂයන් 05ක් සඳහා රු. 13,000/= |
| | විෂයන් 06ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා රු. 15,000/= | විෂයන් 06ක් සඳහා රු. 15,000/= |

ලියාපදිංචි කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව රු. 7,000/=

## 5.3. පාඨමාලා ව්‍යුහය

### උපාධි I කොටස

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| COM 1511 | ව්‍යාපාර සඳහා ආර්ථික විද්‍යාව | 75 | 05 |
| COM 1512 | කළමනාකරණ මූලධර්ම | 75 | 05 |
| COM 1513 | ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රමවේද | 75 | 05 |
| COM 1514 | මූල්‍ය ගිණුම්කරණය | 75 | 05 |
| COM 1515 | ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය | 75 | 05 |
| COM 1316 | ව්‍යාපාර සන්නිවේදනය | 45 | 03 |
| COM 1317 | කළමනාකරණ කුසලතා සංවර්ධනය | 45 | 03 |
| | | | 31 |

### උපාධි II කොටස

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| COM 2511 | මූල්‍ය කළමනාකරණය | 75 | 05 |
| COM 2512 | අලෙවි කළමනාකරණය | 75 | 05 |
| COM 2513 | මෙහෙයුම් කළමනාකරණය | 75 | 05 |
| COM 2514 | පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය | 75 | 05 |
| COM 2515 | ව්‍යාපාර නීතිය | 75 | 05 |
| COM 2316 | සංවිධාන චර්යාව | 45 | 03 |
| COM 2317 | මානව සම්පත් කළමනාකරණය | 45 | 03 |
| | | | 31 |

**උපාධි III කොටස**

| විෂය සංකේතය | විෂය | සම්භාර පැය ගණන | සම්භාර අගය |
|---|---|---|---|
| COM 3511 | අන්තර්ජාතික වෙළඳාම හා සංවර්ධනය | 75 | 05 |
| COM 3512 | උපායක්‍රමික කළමනාකරණය | 75 | 05 |
| COM 3513 | විගණනය හා බදුකරණය | 75 | 05 |
| COM 3514 | උසස් මූල්‍ය ගිණුම්කරණය | 75 | 05 |
| COM 3515 | ඩිජිටල් ව්‍යාපාර කළමනාකරණය | 75 | 05 |
| COM 3516 | බැංකුකරණය හා රක්ෂණය | 75 | 05 |
| | | | 30 |

## 5.4. පාඨමාලා විස්තරය

## උපාධි I කොටස

### (i) COM 1511 - ව්‍යාපාර සඳහා ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය ශිෂ්‍යයින්ට හඳුන්වාදීම සඳහාත් විශේෂයෙන්ම සූක්ෂම හා සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයන් හා එහි භාවිතාවන් පිළිබඳව දැනුම වර්ධනය කිරීම සඳහා මෙම විෂය ඒකකය නිර්මාණය කර තිබේ. පාරිභෝගිකයින්, නිෂ්පාදකයින් හා සම්පත් හිමියන් වැනි තනි ආර්ථික ඒකකයන් සීමිත සම්පත් භාවිතයෙන් තමන්ගේ ප්‍රතිලාභ වැඩි කර ගැනීම යන ගැටළුවට පිළිතුරු සොයන ආකාරයත් හා ඔවුන් ගනු ලබන තීරණ වෙළඳපල තත්ත්වයන්ට, මිල හා නිෂ්පාදනයට බලපානු ලබන ආකාරය සූක්ෂම ආර්ථික විද්‍යාව මඟින් අධ්‍යනය කරනු ලබයි. මෙම සූක්ෂම ආර්ථික විද්‍යාව විෂය ඒකකය තුළ පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යාය, නිෂ්පාදනය හා පිරිවැය පිළිබඳ න්‍යායන්, වෙළඳපල ව්‍යුහ වැනි සංකල්ප ඇතුළත් වේ. එසේම, වර්තමාන ආර්ථික පද්ධති තුළ පවතින සාර්ව ආර්ථික විද්‍යා ප්‍රවණතාවයන් හා ගැටළු අධ්‍යයනය කිරීම සඳහා ශිෂ්‍යයින්ට ප්‍රධාන සාර්ව ආර්ථික විද්‍යා ඒකකයන්, ගැටළු හා ආර්ථික ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීමට හා අධ්‍යයනය කිරීමට අවශ්‍ය න්‍යායාත්මක රාමු

අධ්‍යයනය කිරීමද සිදු වේ. මෙම විෂය ඒකකය අවසානයේදී ශිෂ්‍යයින්ගේ සූක්ෂම හා සාර්ව ආර්ථික විද්‍යා ක්ෂේත්‍ර යටතේ ආර්ථිකයක හැසිරීම විශ්ලේෂණය කිරීමේ හැකියාව අපේක්ෂා කෙරේ.

## (ii) COM 1512 - කළමනාකරණ මූලධර්ම

නූතන ව්‍යාපාරික පරිසරය පෙරටත් වඩා වර්තමානයේ ව්‍යාකූල වීම හේතුවෙන් සීමිත සම්පත් ඵලදායීව යොදා ගනිමින් තම අරමුණු ළඟා කර ගැනීමටත්, සමාජ ගැටළු විසඳීමටත් සංවිධාන වලට සිදුවී ඇත. එබැවින්, ''කළමනාකරණය'' යන සංකල්පය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමත් එය ආයතන හා සමාජය තුළ ඉටු කරන භූමිකාව හඳුනා ගැනීමත් අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, මෙම විෂය ඒකකය මඟින් මූලික කළමනාකරණ සංකල්ප, න්‍යායන් හා ක්‍රමවේද වර්තමාන ව්‍යාපාර සංවිධානයක් ව්‍යාපාරික සමාජ වගකීම් ඉටු කරමින් තම ආයතනයට උසස් කාර්යසාධනයක් ලඟා කර ගැනීමට යොදා ගන්නා ආකාරය පිළිබඳව ශිෂ්‍යයන්ට - අනාගත කළමනාකරුවන්ට අවබෝධයක් ලබාදෙයි. ඒ අනුව, සැළසුම්කරණය, සංවිධානකරණය, නායකත්වය, පාලනය, සංවිධානයක තීරණ ගැනීම හා ව්‍යාපාරය හා එහි පරිසරය අතර පවත්නා සම්බන්ධතා කළමනාකරණය කිරීමට ශිෂ්‍යයින්ට අවශ්‍ය දැනුම හා කළමනාකරණ කුසලතා ලබා දීමට මෙම විෂය ඒකකය කටයුතු කරයි.

## (iii) COM 1513 - ව්‍යාපාර සඳහා ප්‍රමාණාත්මක ක්‍රමවේද

මෙම විෂය ඒකකය මඟින් ව්‍යාපාර හා ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයන්ට සංඛ්‍යාත්මක ක්‍රමවේද භාවිතයට අවශ්‍ය ගණිතය හා සංඛ්‍යානය පිළිබඳව ශිෂ්‍යයින්ට හැඳින්වීමක් ලබාදෙයි. මෙම විෂයේ පළමු අර්ධය සමීකරණ, ශ්‍රිත, කලනය හා මූල්‍ය ගණිතය පිළිබඳවත්, දෙවන අර්ධය ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ කුසලතා වර්ධනයට අවශ්‍ය විස්තරාත්මක සංඛ්‍යානය, සම්භාවිතා ව්‍යාප්ති, සහසම්බන්ධතා හා රේඛීය ප්‍රතිපායනය පිළිබඳව අවධානය යොමු කරයි.

## (iv) COM 1514 - මූල්‍ය ගිණුම්කරණය

මෙම පාඨමාලා ඒකකය මූල්‍ය ගණකාධිකරණය පිළිබඳව ශිෂ්‍යයින්ගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික ප්‍රවීණතාවය වර්ධනයට නිර්මාණය කර ඇත. මෙමඟින් මූල්‍ය ගණකාධිකරණය හා සංවිධාන ඒකක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මූලික අවබෝධයක් ලබා දෙන අතරම මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් මූලික හැකියා හා කුසලතා වර්ධනයට අවධානය යොමු කරයි. මෙය මූල්‍ය ගණකාධිකරණය පිළිබඳ සමස්ත අවධානයක් ලබා දීම, ද්විත්ව සටහන් න්‍යාය භාවිතය, ගණකාධිකරණ පද්ධති, මූලික සටහන් පොත් හා ජ'නල්, ගනුදෙනු හා සිද්ධීන්

ජ'නල් ගිණුම්වල සටහන් කිරීම, වැරදි හඳුනා ගැනීම හා නිවැරදි කිරීම, තනි ආයතනයක මූල්‍ය ප්‍රකාශන, නිෂ්පාදන ගිණුම් හා ලාභ අරමුණු කළ නොගත් සංවිධානවල ගිණුම් යන විෂය ක්ෂේත්‍ර ආවරණය කරනු ලබයි.

### (v) COM 1515 - ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය

නූතන ව්‍යාපාර පරිසරය තුළ තාක්ෂණය භාවිතය පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් මෙම පාඨමාලාව ලබාදෙයි. මෙම විෂය ඒකකය මඟින් තොරතුරු තාක්ෂණය හා තොරතුරු තාක්ෂණ පද්ධති යොදා ගනිමින් ආයතනයක කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය හා තරඟකාරීත්වය ඉහළ නැංවෙන ආකාරය අධ්‍යයනය කරයි.

### (vi) COM 1316 - ව්‍යාපාර සන්නිවේදනය

වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳව පාඨමාලාවක් වන මෙය භාෂාව පිළිබඳව මූලිකාංග සමඟ සරළ මට්ටමකින් ආරම්භ වේ. මෙම විෂයට ඇතුලත් වීමට ශිෂ්‍යයෙකුට පූර්ව අතරමැදි (Pre-intermediate) භාෂා හැකියාවක් පැවතීම ප්‍රමාණවත් වේ. මෙම පාඨමාලාව මඟින් වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ කියවීම, ලිවීම, සවන්දීම හා කතාකිරීම යන කුසලතා වර්ධනය කරනු ලබන අතරම ඉංග්‍රීසි ව්‍යාකරණ හා වචනමාලා පිළිබඳව පුළුල්ව සාකච්ඡා කෙරේ.

### (vii) COM 1317 - කළමනාකරණ කුසලතා සංවර්ධනය

ශිෂ්‍යයින්ට තම රැකියාව, සමාජ වගකීම්, පෞද්ගලික සංවර්ධනය හා ජීවිත කාලීන අඛණ්ඩ ඉගෙනීම සඳහා අවශ්‍ය වන කළමනාකරණ කුසලතා හා සාමාන්‍ය යෝග්‍යතාවය හා බුද්ධිය සම්බන්ධ විෂය මූලික දැනුම මෙම පාඨමාලාව තුළින් හිමිවේ.

## උපාධි II කොටස

### (i) COM 2511 – මූල්‍ය කළමනාකරණය

ආයතනයක ආයෝජන හා මූල්‍ය තීරණ පිළිබඳව මූලික අවධානය යොමු කරමින් මූල්‍ය කළමනාකරණ සංකල්ප හා ශිල්පක්‍රම සම්බන්ධයෙන් මූලික අවබෝධයක් මෙම විෂය මඟින් ලබා දෙයි. මූල්‍ය පරිසරය, වෙළෙඳපළ හා විශ්ලේෂණය, අවදානම, ප්‍රතිලාභ හා තක්සේරු කිරීම හා

ආයතනික මූල්‍ය යන කොටස් අනුව මූල්‍ය තීරණ ගන්නා අවස්ථාවන් පිළිබඳව අධ්‍යයනයට අවශ්‍ය ක්‍රමවේද හා සංකල්ප දක්වමින් මෙම පාඨමාලාව නිර්මාණය කර ඇත.

## (ii) COM 2512 –අලෙවි කළමනාකරණය

අලෙවිකරණ සංකල්ප, න්‍යායන් , මූලධර්ම හා භාවිතාවන් ගතික ව්‍යාපාර පරිසරයක් තුළ භාවිතා වීම සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබා දෙන මෙම විෂය ඒකකය අතරමැදි මට්ටමේ විෂයයක් වේ. එසේම ශිෂ්‍යයින්ට සදාචාරාත්මක පැතිකඩයන් අනුව සළකා බලමින් නූතන අලෙවිකරණ ගැටළු හා භාවිතයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ. මෙම පාඨමාලාව තුළින් අලෙවිකරණ දර්ශනයන් හඳුනා ගැනීම, වෙළෙඳපළ දර්ශනයන් තක්සේරු කිරීම, පාරිභෝගිකයින් සමඟ සම්බන්ධ වීම, වෙළෙඳනාමය ස්ථානගත කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම, තරගකාරී ගතිකත්වයන් කළමනාකරණය කිරීම, වෙළෙඳපළ පිරිනැමීම් නිර්මාණය කිරීම, වටිනාකම් ලබා දීම, වටිනාකම් සන්නිවේදනය කිරීම හා දිගු කාලීන සාර්ථක වර්ධනයක් නිර්මාණය කිරීම යන කොටස් ආවරණය කරයි.

## (iii) COM 2513 – මෙහෙයුම් කළමනාකරණය

නිෂ්පාදන හා සේවා ආයතනයන්හි භාවිතා වන මෙහෙයුම් කළමනාකරණ සංකල්ප, මෙවලම් හා ක්‍රමවේද සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දීමට මෙම පාඨමාලාව අරමුණු කරයි. ඒ අනුව මෙහෙයුම් කළමනාකරණයට අදාල සංකල්ප, ප්‍රවේශ, නිර්මාණ හා භාවිතයන්ට අදාල මාතෘකා මෙමඟින් ආවරණය කරයි. එහිදී මෙහෙයුම් කළමනාකරණයට අදාල මූලික සංකල්ප, මූලධර්ම හා නිර්මාණයන් මෙන්ම සමාන්තර කළමනාකරණ කාර්යයන් සමඟ පවත්නා සම්බන්ධතාවය හා අන්තර්ක්‍රියා සමඟ අවසන් අරමුණ වෙත ආයතනයක් ළඟා වීම සම්බන්ධවද මෙම විෂය ඒකකය අවධානය යොමු කරයි. මෙහෙයුම් උපාය මාර්ග හා තරගකාරීත්වය, නිෂ්පාදිත නිර්මාණය, ක්‍රියාවලි තෝරා ගැනීම, සම්පූර්ණ ගුණාත්මකභාවය කළමනාකරණය (TQM), ධාරිතා කළමනාකරණය, පිහිටුවීම් සැළසුම් කිරීම හා තොග කළමනාකරණය යන මූලික කොටස් මෙමඟින් ආවරණය කරයි.

## (iv) COM 2514 – පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය

මෙම පාඨමාලාවේ මූලික පරමාර්ථය වන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තීරණ ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වූ මෙවලම්, ශිල්ප ක්‍රම හා පද්ධති පිරිවැය භාවිතයෙන් කළමනාකරුවන් ලබා දෙන තොරතුරු ඇතුළුව පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳව සිසුන්ට

අවබෝධයක් ලබා දීමයි. මෙමගින් සිසුන් සතු පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණ දැනුම වර්ධනය කරයි. පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය විශ්ලේෂණය, පිරිවැය වර්ගීකරණය, අමුද්‍රව්‍ය වියදම් සඳහා ගිණුම්කරණය, ශ්‍රම පිරිවැය ගිණුම්කරණය, පොදුකාර්යය පිරිවැය ගිණුම්කරණය, පිරිවැය ගිණුම්කරණ ක්‍රම, ඒකාබද්ධ නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන, අයවැය, සකස් කිරීම හා පාලනය, සම්මත පිරිවැය, විචලතා විග්‍රහය, කෙටි කාලීන හා දිගු කාලීන තීරණ ගැනීම යන කොටස් කෙරෙහි මෙම පාඨමාලාව විශේෂ අවධානයක් යොමු කරයි.

## (v) COM 2515- ව්‍යාපාර නීතිය

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමට අදාල නීතිමය පසුබිම මෙමගින් ආවරණය කරයි. එසේම, ව්‍යාපාර වලට පවත්නා ගැටළු විසඳීමට යොදා ගත හැකි විවිධ නීති සංකල්ප කෙරෙහිද මෙම පාඨමාලාව අවධානය යොමු කරයි. ඒ අනුව ව්‍යාපාර නීතිය හැඳින්වීම, ගිවිසුම් නීතිය, දිලික්ත නීතිය භාණ්ඩ විකිණීමේ නීතිය, නියෝජ්‍යත්ව නීතිය, හවුල් ව්‍යාපාර, තොරතුරු තාක්ෂණ නීතිය, අන්තර්ජාතික වෙළෙඳාමට අදාල නීතිය, බදු මූලධර්ම, කම්කරු නීතිය, සමාගම් නීතිය, බුද්ධිමය දේපල නීතිය හා රක්ෂණ නීතිය මෙමගින් ආවරණය කරයි. මෙහිදී සිසුන්ට නීති හා රෙගුලාසි කඩවීමෙන් ඇතිවන නීතිමය හා සමාජීය හානිය පිළිබඳව සිසුන්ව දැනුවත් වීමක් අපේක්ෂා කරයි.

## (vi) COM 2316- සංවිධාන චර්යාව

රැකියා පරිසරය තුළ සංකීර්ණ මානව චර්යාවන් කළමනාකරණය කිරීම වෙහෙසකර කාර්යයක් වී ඇත. මෙම සංකීර්ණත්වය හේතුවෙන් මානව චර්යාවන් අවබෝධ කරගැනීම සඳහා ක්‍රමානුකූල දැනුමක් අවශ්‍ය වූ අතර, ඒ අනුව සංවිධාන චර්යාව විෂය ඒකකයක් ලෙස බිහි විය. සංවිධාන චර්යාව පුද්ගලික ආයතනික හා සමාජීය යහපැවැත්ම උදෙසා මානව චර්යාවන් හඳුනා ගැනීම පුරෝකථනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් ලබා දෙයි. මෙම විෂය ඒකකය මඟින් තම වර්තමාන හෝ අනාගත කළමනාකරණ චර්යාවන් පරීක්ෂා කිරීමටත් ඒවා රැකියා ස්ථානය තුළ යොදා ගැනීමටත් ශිෂ්‍යයින්ට හැකියාව ලබා දෙයි. මෙම පාඨමාලාවේ මූලිකම ලක්ෂණය වනුයේ ඒ තුළ වර්තමාන හා මතුවෙමින් පවත්නා සංවිධාන චර්යාවන්හි සංවර්ධනයන් ඇතුළත්ව තිබීමයි.

## (vii) COM 2317 -මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණය හා මානව සම්පත් වෘත්තිකයෙකුගේ උපාය මාර්ගික සහකරුවෙක් වශයෙන් ආයතනයක් කළමනාකරණයට දායක වීමට අදාල මූලික සංකල්ප, ක්‍රමවේද හා කාර්යයන් පිළිබඳව ක්‍රමානුකූල හා තාර්කික අවබෝධයක් මෙම විෂය මඟින් ලබා දෙයි. මෙම

පාඨමාලාව ශ්‍රී ලාංකික මානව සම්පත් වලට අදාල ගැටළු හඳුනාගැනීමට හා හසුරුවාලීමට විශේෂ අවධානයක් යොමු කරමින් ක්‍රමානුකූල හා විද්‍යාත්මක ප්‍රවේශයක් සිසුන්ට ලබා දෙයි.

## උපාධි III කොටස

### (i) COM 3511 – අන්තර්ජාතික වෙළඳාම හා සංවර්ධනය

වෙළෙඳාමට අදාළ මූලධර්ම, පිළිවෙත් හා ඒවා මඟින් ලෝකය සංවර්ධනය වීමට නිදහස් වෙළඳාමේ ඇති අවශ්‍යතාවය ඒ පිළබඳව පුළුල් අවබෝධයක් ලබා දීමට  මෙම පාඨමාලාව අපේක්ෂා කරයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පවත්නා වෙළෙඳ ගැටළු සම්බන්ධයෙන් වර්තමාන වෙළෙඳ මූලධර්ම විශ්ලේෂණය කරමින් විසඳුම් ලබා දීම මෙමඟින් අරමුණු කරයි.

මෙම විෂය මඟින් වෙළඳ න්‍යායන් හා මූලධර්ම සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබා දෙමින් වෙළෙඳ සීමාවන් සඳහා හේතු හා ඒවායින් ඇති බලපෑමත් වෙළඳ ආරක්ෂණවාදය හා ආර්ථික ඒකාබද්ධතාවය පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීම සඳහා නිර්මාණය කර ඇත. එසේම නූතන වෙළෙඳාම ආශ්‍රිව ඇති සමකාලීන ගැටළු වන අපනයන අස්ථායීතාවය, තාක්ෂණික දියුණුව, අක්වෙරළ හා බාහිරින් පැවරීම වැනි සංකල්ප අධ්‍යයනය තුළින් සිසුන්ගේ ගැටළු විසඳීමේ කුසලතා දියුණු කිරීමද මෙම පාඨමාලාව අපේක්ෂා කරයි. ඒ අනුව මෙම විෂය අවසානයේදී අන්තර්ජාතික වෙළෙඳාම දියුණු කිරීමට සිසුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය වීමක් සිදුවේ.

### (ii) COM 3512 - උපායක්‍රමික කළමනාකරණය

වර්තමාන ව්‍යාපාර පරිසරය වර්තමානයේදී අතීතයට වඩා සංකීර්ණ වී ඇත. වර්තමානයේදී කුඩා ව්‍යාපාර සංවිධාන වලට පවා පෙරට වඩා ගැටළු හා අවස්ථාවන්ට මුහුණ දීමට සිදු වී ඇත.  ඒ අනුව නූතන ගෝලීය සංදර්භයේදී, ව්‍යාපාර තම තරඟකාරීත්වය හා පැවැත්ම සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කරයි. ඒ අනුව සලකා බැලීමේදී මෙම විෂය මඟින් උපායමාර්ගික කළමනාකරණය හැඳින්වීම හා වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ ආයතනයක් මෙහෙයවීමේදී ඇතිවන ගැටළු පිළිබඳව මෙම විෂය ඒකකය සාකච්ඡා කරයි. මෙම විෂය අවසානයේදී ශිෂ්‍යයින්ට උපායමාර්ගික සිතීම හා තීරණ ගැනීමේ හැකියාව අනුව විවිධ අවශ්‍යතාවයන්ට ගැළපෙන උපායමාර්ග භාවිතා කිරීමට සිසුන්ට හැකියාවක් ලැබේ.

### (iii) COM 3513- විගණනය හා බදුකරණය

ගිණුම්කරණය හා මූල්‍ය විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රධන කොටස් 02ක් වන ආයතනික බදුකරණය හා විගණනය (විගණනය 50% හා බදුකරණය 50%) සම්බන්ධයෙන් සිසුන්ගේ ප්‍රායෝගික හා තාක්ෂණික හැකියා වර්ධනය කිරීමට මෙම විෂය අපේක්ෂා කරයි.

ඒ අනුව බදු මූලධර්ම, බදු වලට අදාල මූලික ආදායම් මාර්ග, සමාගම් බදුකරණය හා බදු පරිපාලනය හා බදු ආශ්‍රිත කාලීන ගැටළු පිළිබඳව සිසුන්ට අවබෝධයක් හිමි වේ. විගණනය කොටසේදී සහතිකවීම්, අභ්‍යන්තර පාලනයන්, විගණන සැලසුම්, විගණන සාක්ෂි හා විගණන වාර්තා ආදිය පිළිබඳව සාකච්ඡා කරයි.

මෙම පාඨමාලාව අවසානයේදී ශිෂ්‍යයින්ට මෙම ඒකක 02 සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් මෙන්ම ඊට අදාල අනුකූල වීමේ අවශ්‍යතාවයන් කළමනාකරණය පිළිබඳ හැකියාවක් හිමිවේ.

## (iv) COM 3514 – උසස් මූල්‍ය ගිණුම්කරණය

මෙම පාඨමාලාව පළමු වසරේදී පිරිනමනු ලබන මූල්‍ය ගණකාධිකරණය විෂයේ දිගුවක් වේ. ඒ අනුව මෙහිදී මූල්‍ය ගිණුම්කරණයේ සංකීර්ණ සංකල්ප හා ක්‍රමවේද සාකච්ඡා වීමක් සිදුවේ. මෙම පාඨමාලාව මගින් සිසුන්ට මූල්‍ය ගිණුම්කරණ සංකල්ප හා භාවිතාවන් මෙන්ම ඒවා භාවිතයෙන් පවතිනා ගැටළු තක්සේරු කර ඒවාට තාර්කික විසඳුම් ලබාදීම අපේක්ෂා කරයි.

## (v) COM 3515 – ඩිජිටල් ව්‍යාපාර කළමනාකරණය

මෙම විෂය ඩිජිටල් පරිවර්තනය යනු කුමක්ද යන්න නිශ්චිතව හඳුන්වාදීමත් සංවිධාන සඳහා එහි අවශ්‍යතාවය හඳුන්වා දීමත් සමඟ ආරම්භ වේ. ඒ අනුව, ඩිජිටල්කරණය සඳහා බලපෑම් කරනු ලබන සාධක හා ඩිජිටල්කරණයේදී ආයතන මුහුණපාන ගැටළු හා දුෂ්කරතා පිළිබඳවත්, සාර්ථක ඩිජිටල්කරණයක් කරා ළඟා වීමට ආයතනයකට යොදා ගත හැකි උපායමාර්ග හා එම ක්‍රියාවලිය කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි. එසේම, ආයතනයකට වර්තමාන ගතික හා තරඟකාරී පරිසරය තුළ භාවිතා කළ හැකි විවධ ඩිජිටල් තාක්ෂණයන් පිළිබඳව දැනුමද මෙම විෂය ඒකකය තුළින් ශිෂ්‍යයින්ට හිමිවේ.

## (vi) COM 3516 - බැංකුකරණය හා රක්ෂණය

මෙමගින් ශ්‍රී ලංකාවේ භාවිතා වන බැංකුකරණයේ න්‍යායන් හා භාවිතයන් පිළිබඳවත්, රක්ෂණ කටයුතු පිළිබඳවත් පුළුල් දැනුමක් සිසුන්ට ලබා දෙයි.

## 6. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ විභාග නීතිරීති සහ රෙගුලාසි

මෙම රෙගුලාසි මගින් මෙම උපාධියට අදාළ උපමානයන් හා අනෙකුත් කොන්දේසි සපයනු ලබයි. රෙගුලාසි සම්බන්ධ ඕනෑම අර්ථකථනයක් වේ නම්, සනාතන සභාව වෙත ඉදිරිපත් කරනු ඇති අතර, සනාතන සභාවේ තීරණය අවසාන තීරණය වේ. විභාග නීතිරීති සම්බන්ධ අත්පොත www.external.sjp.ac.lk වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

### a) සම්භාර අගය (Credits)

අධ්‍යයන නිපුණතාව ගණනය කිරීමේ මිනුම් දණ්ඩ 'සම්භාර අගය' යනුවෙන් හැඳින්වේ. සම්භාර අගය එකක් යනු අධ්‍යයන පැය පහළොව (15) කි. එකී පදනම මත, එක් එක් පාඨමාලාවක් සඳහා ලබාදෙන සම්භාර අගයයන් සංඛ්‍යාව පහත 01 වගුවෙහි සඳහන් වේ.

| සම්භාර අගය | අධ්‍යයන පැය ගණන |
|---|---|
| 1 | 15 |
| 2 | 30 |
| 3 | 45 |
| 4 | 60 |
| 5 | 75 |

වගුව 01 : අධ්‍යයන හෝරා සහ සම්භාර අගය අතර සබඳතාවය

### b) ශිෂ්‍යයාගේ අධ්‍යයන කාර්යභාරය

උපාධි I කොටස සඳහා සම්භාර පැය 31 ක් ද උපාධි II කොටස සඳහා සම්භාර පැය 31 ක් ද උපාධි III කොටස සඳහා සම්භාර පැය 30 ක් වේ. සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා අදාළ වන මුළු සම්භාර පැය ගණන 92 කි.

## c) ශ්‍රේණිගත කිරීමේ මිනුම්

කාණ්ඩ 12ක විසිරීම මත සිසුවාගේ කාර්යසාධනය ශ්‍රේණිගත කෙරෙනු ඇත. A+ (විශේෂිත) සිට E (අසමත්) දක්වා පරාසයක් තුළ එම ශ්‍රේණිගත කිරීම සිදු කෙරේ. ශ්‍රේණිගත කිරීමේ මිනුම් පහත 02 වගුවෙහි දක්වා ඇත. ‘MC’ යනුවෙන් දක්වා ඇත්තේ වෛද්‍ය හේතුන් මත ඉවත්වීමය.

| ලකුණු පරාසයන් | ශ්‍රේණිය | එක් සම්භාර පැයක් සඳහා වන ශ්‍රේණි ලකුණු |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E | 0.00 |

වගුව 02 : ශ්‍රේණිගත කිරීමේ මිනුම්

## d) ශ්‍රේණිගත සාමාන්‍ය අගය ගණනය කිරීම සඳහා උපදෙස්

ශ්‍රේණිගත සාමාන්‍ය අගය {Grade Point Average (GPA)} යනු සිසුවකුගේ සමස්ත අධ්‍යාපන ජයග්‍රහණයන් පෙන්නුම් කිරීමේ සංඛ්‍යාත්මක ක්‍රමවේදයයි. GPA යනු, සිසුවාට 'අක්ෂර' ශ්‍රේණියක් ලැබෙන මුලු ශ්‍රේණිගත ලකුණු බෙදීමෙන් ලබාගන්නා ඵලයයි. GPA ගණනය කිරීමේදී, ස්ථාන දෙකකට වඩා ඇති දශමස්ථාන කපා හරින අතර, රවුම් සංඛ්‍යාවක් කරනු ලැබේ.

GPA ගණනය කිරීමේ සූත්‍රය පහත පරිදි වේ.

$$\mathbf{GPA} = \frac{\sum_{i=1}^{N} (Credits)_I \, X \, (Grade\ points\ Per\ Hour)_i}{\sum_{i=1}^{N} (Credits)_i}$$

i = පාඨමාලා අංකය, සහ N = සැලකිල්ලට ගත් පාඨමාලා සංඛ්‍යාව

උපරිම වශයෙන් ලබාගත හැකි GPA මට්ටම 4.00ක ට සීමාවන අතර, අවමය 0කි. උපාධි පාඨමාලාවේ උපාධි III කොටසේදී මනඃකල්පිත සිසුවකුගේ GPA මට්ටම ගණනය කිරීම පහත 03 වගුවෙහි දැක්වේ.

| පාඨමාලා කේතය | ලබාගත් ශ්‍රේණි අක්ෂරය | සම්භාර පැය ගණන | පැයකට ශ්‍රේණිගත ලකුණු | ලබාගත් ශ්‍රේණිගත ලකුණු අගය = සම්භාර පැය ගණන × පැයකට ලබාගත් ශ්‍රේණිගත ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| COM 3511 | A+ | 5 | 4.00 | 20.00 |
| COM 3512 | A- | 5 | 3.70 | 18.50 |
| COM 3513 | B+ | 5 | 3.30 | 16.50 |
| COM 3514 | C+ | 5 | 2.30 | 11.50 |
| COM 3515 | D | 5 | 1.00 | 05.00 |
| COM 3516 | A | 5 | 4.00 | 20.00 |
| **Total** | | **30** | | **91.50** |

GPA = $\frac{\text{ලබාගත් මුළු ශ්‍රේණිගත ලකුණු අගය}}{\text{සම්පූර්ණ සම්භාර පැය ගණන}} = \frac{91.5}{30} = 3.05^{*}$

* **GPA** ගණනය කිරීමේදී දෙකකට වැඩි දශමස්ථාන කෙටි කර ඇත. පූර්ණ සංඛ්‍යාවන් ලෙස දක්වා නොමැත.

වගුව 03 : GPA මට්ටම ගණනය කිරීමේ නිදර්ශනය

## 7. ඇගයීම

සෑම පාඨමාලාවක් සඳහා ම අධ්‍යයන වර්ෂය අවසානයේ දී අවසන් විභාගයක් පැවැත්වේ. එක් එක් පාඨමාලාවේ අවශ්‍යතාවයන් අනුව විභාගය සඳහා ගතවන කාලය වෙනස්විය හැකි ය. සාමාන්‍යයෙන් එය එක් විෂයක් සඳහා පැය තුනක කාලයකි.

### a) උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලබාදෙන උපරිම කාලසීමාව

උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවසර දෙනු ලබන උපරිම කාලසීමාව වන්නේ ලියාපදිංචි වූ වර්ෂයේ සිට නොකඩවා අධ්‍යන **වසර හත (07)ක කාලයකි.** මෙම කාලසීමාවෙන් පසුව කිසිඳු හේතුවක් නිසා කාලය දීර්ඝ කිරීමට අවසර ලබා දෙනු නොලැබේ. මෙම කාලසීමාව ඇතුළත කිසියම් සිසුවකු සිය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුට හෝ ඇයට නව අයදුම්කරුවකු වශයෙන් පාඨමාලාව සඳහා යලි ලියාපදිංචි විය හැකි අතර, පෙර හැදෑරීමේ දී ලබාගත් ප්‍රතිඵල එමඟින් ශූන්‍ය හා බලරහිත වශයෙන් සැලකෙනු ඇත.

### b) එක් පාඨමාලාවක් සඳහා උත්සහ කළ හැකි වාර ගණන

අධ්‍යයන වර්ෂ හතක (07) කාලය තුළ උපාධි I කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි හත් වරක් (07), උපාධි II කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි හය වරක් (06), උපාධි III කොටසේ එක පාඨමාලාවක් සඳහා පවත්වනු ලබන පරීක්ෂණවලදි පස් වරක් (05) පෙනී සිටීමේ අවස්ථාව උපාධි අපේක්ෂකයන්ට හිමි වේ.

### c) සම්භාර අගය සහිත පාඨමාලාවක් සමත්වීම හෝ අසමත්වීම

අදාළ පාඨමාලාව සඳහා ඔහු/ ඇය ලබාගත් සමස්ත සාමාන්‍ය 40%ක් හෝ ඊට ඉහළ නම් (C සාමාර්ථ්‍යය හෝ ඊට ඉහළ සාමාර්ථ), එකී අයදුම්කරු එම සම්භාර අගය සහිත පාඨමාලාව සමත් වූ බවට සැලකෙනු ඇත.

## d) සම්භාර අගය සහිත පාඨමාලාවක් නැවත හැදෑරීම

- 'D' හෝ 'E' ශ්‍රේණියක් ලබාගන්නා සිසුවකු, පාඨමාලාව නැවත හැදෑරීම සඳහා ඊළඟ අධ්‍යයන වර්ෂයේ දී එකී පාඨමාලාව සඳහා ලියාපදිංචි වී එකී පාඨමාලාව සම්පූර්ණ කළ යුතු ය.
- එක් අධ්‍යන වර්ෂයක් සඳහා GPA අගය 2.00ට අඩු අගයක් සහිතව 'C-' හෝ 'D+' ශ්‍රේණියක් ලබාගන්නා සිසුවකු හට, ඊළඟ අධ්‍යයන වර්ෂයේ දී එකී පාඨමාලාව සඳහා ලියාපදිංචි වී එකී පාඨමාලාව සම්පූර්ණ කළ යුතු ය.
- පරීක්ෂණයකට නැවත පෙනී සිටින අයදුම්කරුවකු, එම පරීක්ෂණය සඳහා තමා ලබාගන්නා ලකුණු සංඛ්‍යාව කුමක් වුවත්, ලබාදෙන උපරිම ලකුණු සංඛ්‍යාව 40%කි. නැවත හදාරනු ලබන පාඨමාලාවක් සඳහා ලබාදෙන උපරිම ශ්‍රේණිය 'C' වේ.
- නැවත උත්සහ කිරීමේ දී සිසුවා ලබාගන්නා ශ්‍රේණිය පෙර උත්සහයේ දී ලබාගත් ශ්‍රේණියට පහළ ශ්‍රේණියක් වුවහොත් ලබා ඇති, වඩා ඉහළ ශ්‍රේණිය බලපැවැත්වෙනු ඇත.
- සාධාරණ හේතුවකින් තොර ව අදාළ අධ්‍යයන වර්ෂයේ දී විභාගයට පෙනී සිටීමට අපොහොසත් වන සිසුවකු නැවත හදාරන/පුනර් සිසුවකු වශයෙන් සැලකෙනු ඇත.

## e) විභාගයක් සමත්වීම

අයදුම්කරුවකු අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් (GPA අගය) 2.00ට නොඅඩු මට්ටමක් ලබාගත් විට හා එම අධ්‍යයන වර්ෂයේදී ලබාගත් දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව එකකට නොවැඩි වූ විට සහ අසමත් ශ්‍රේණි ('D' හෝ 'E') නොමැති විට ඔහු/ ඇය එම විභාගය සමත් වූ ලෙසට සලකනු ලබයි. සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා දුර්වල ශ්‍රේණි සංඛ්‍යාව තුනක් නොඉක්මවිය යුතු ය.

## 8. විභාග ප්‍රතිඵල

ඉහත 03 වගුවෙහි දක්වා ඇති පරිදි, එක් එක් පාඨමාලාව සඳහා ලබා ඇති ශ්‍රේණිය (Grade) සහ GPA මට්ටම අයදුම්කරු වෙත දන්වනු ඇත. එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව එක් එක් අයදුම්කරු වෙත ප්‍රතිඵල පත්‍රය ලබාදෙනු ඇත.

## 8.1. වෛද්‍ය හේතූන් මත ඉවත්වීම

වලංගු ලිඛිත සාධක මත වෛද්‍ය හේතූන් සම්බන්ධයෙන් (ඇමුණුම 3) සිසුවකුට උපාධි පාඨමාලාවක් සඳහා වන විභාගයකට පෙනී නොසිට ඉවත්විය හැකි ය. එවැනි අවස්ථාවක දී 'MC' සංකේතය සිසුවාට ලැබෙනු ඇත. වෛද්‍ය හේතූන් මත ඉවත්වීමට ඉල්ලා සිටීමේ දී ඒ සම්බන්ධයෙන් www.external.sjp.ac.lk වෙබ් අඩවියේ පළ කර ඇති විශ්වවිද්‍යාලයේ උපදෙස් සිසුවා විසින් අනුගමනය කළ යුතු අතර, ඊළඟ වර්ෂයේ දී සිසුවා එකී පාඨමාලාව/ පාඨමාලා සඳහා පෙනී සිටිය යුතු ය.

## 8.2. පරීක්ෂණ සඳහා නැවත යොමු කරවීම

ඉහත 7 (e) කොටසෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වූ අයදුම්කරුවකු අදාළ විභාගය සඳහා නැවත යොමු කරවනු ඇත. නැවත යොමුකරවන ලද (Reffered) ශිෂ්‍යයෙක්, අසමත් වූ සම්භාර අගය සහිත (සියලු 'D' සහ 'E' ශ්‍රේණි) විෂයයන් හට ඉහත 7 (d) කොටසේ දක්වා ඇති නියමයන්ට අනුකූලව ඉදිරිපත් වී එම විෂයන් සමත් විය යුතුය.

## 9. උපාධියක් සම්පූර්ණ කිරීම : උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන්

උපාධියක් ලැබීමට, සිසුවකු විසින් පහත කරුණු සියල්ල සපුරාලිය යුතුවේ.

→ සම්භාර පැය 92ක් සම්පූර්ණ කර තිබීම,

→ එක් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් 2.00ට නොඅඩු GPA මට්ටමක් ලබා තිබීම,

→ සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා 2.00ක අවම සමස්ත GPA මට්ටමක් ලබා තිබීම,

→ අසමත් ශ්‍රේණි ('D' සහ 'E') සහ AB නොතිබීම,

→ එක් අධ්‍යයන වර්ෂයක් සඳහා දුර්වල ශ්‍රේණි ('C-' සහ 'D+') එකකට නොවැඩිවීම,

→ සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා වන දුර්වල ශ්‍රේණි සංඛ්‍යාව 03 නොඉක්මවීම,

→ ප්‍රථමයෙන් ම විශ්වවිද්‍යාලයට බැඳුණු අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් වසර හත (07)ක් ඇතුළත ඉහත දක්වා ඇති සියලු අවශ්‍යතාවන් සපුරා තිබීම.

## 10. පන්ති සාමාර්ථ්‍ය පිරිනැමීම

### a) පළමු පෙළ පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා

පළමු පෙළ පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සපුරාලිය යුතු වේ :

→ සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.7-4.00 පරාසය තුළ සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.

→ උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'A+' හෝ 'A' ශ්‍රේණි ලබා තිබිය යුතුය.

→ 'C' ශ්‍රේණියට පහළ ශ්‍රේණි සිසුවා විසින් ලබා නොතිබිය යුතුය.

→ අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

### b) දෙවන පෙළ (ඉහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා

දෙවන පෙළ (ඉහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සපුරාලිය යුතු වේ:

→ සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.30 හෝ ඊට වැඩි සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.

→ උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'A-' හෝ ඊට වැඩියෙන් ලබා තිබිය යුතුය.

→ උපාධියට අදාළ සම්පූර්ණ කාලයේ දී සිසුවා විසින් ලබා ඇති දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව දෙකකට නොවැඩි විය යුතුය.

→ අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

### c) දෙවන පෙළ (පහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා

දෙවන පෙළ (පහළ අංශයේ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව උපාධිය පිරිනැමීමට නම්, සිසුවා විසින් පහත අවශ්‍යතාවන් සපුරාලිය යුතු වේ :

- → සමස්ත උපාධි පාඨමාලාව තුළ 3.00 හෝ ඊට වැඩි සමස්ත GPA මට්ටමක් සිසුවා විසින් ලබාගෙන තිබිය යුතුය.
- → උපාධියට අදාළ පාඨමාලාවලින් අවම වශයෙන් අඩක් සඳහා සිසුවා විසින් 'B+'හෝ ඊට වැඩියෙන් ලබා තිබිය යුතුය.
- → උපාධියට අදාළ සම්පූර්ණ කාලයේ දී සිසුවා විසින් ලබා ඇති දුර්වල ශ්‍රේණි ('C-' හෝ 'D+') සංඛ්‍යාව දෙකකට නොවැඩි විය යුතුය.
- → අනුමත කළ සාධාරණ හේතු මත හැර, ලියාපදිංචි වූ පළමු අධ්‍යයන වර්ෂයේ සිට අධ්‍යයන වර්ෂ තුන (03)ක් ඇතුළත සිසුවා විසින් මෙම අවශ්‍යතාවන් සපුරා තිබිය යුතුය.

## d) උපාධිය වලංගු වන දිනය

යම් උපාධි අපේක්ෂකයෙකු පළමුවෙන් ලියාපදිංචි වූ වර්ෂයේ සිට උපාධි I, II සහ III පරීක්ෂණ සඳහා ප්‍රථම වරට පෙනී සිටිමින් අනුපිළිවෙලින් සමත් වන්නේ නම් උපාධිය සඳහා වලංගු දිනය වන්නේ තුන්වන අධ්‍යයන වර්ෂයේ විභාග කාලච්ඡේදය අවසන් වන දිනට පසු දිනය (ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවන) වේ.

යම් උපාධි අපේක්ෂකයෙකු එක් අධ්‍යයන වර්ෂයක් හෝ පුනර් පරීක්ෂණයකට පෙනී සිට ඇත්නම් පුනර් අපේක්ෂකයන්ගේ උපාධිය වලංගු වන දිනය වන්නේ එක් එක් කැලැන්ඩර් වර්ෂයෙහි ජුනි 30 හෝ දෙසැම්බර් 31 (හෝ එම දිනය රජයේ නිවාඩු දිනයක් හෝ ඉරිදා දිනයක් වන්නේ නම් එදිනට පසුව එළඹෙන වැඩ කරන දිනය) වශයෙන් අදාල පරිදි ලබා දෙනු ලැබේ.

## e) පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය

පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය සඳහා කැමැත්තක් දක්වන සිසුන් විභාග ප්‍රතිඵල නිකුත් කර දින **14** ක් ඇතුළත ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය. අදාල විස්තර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ www.external.sjp.ac.lk වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ.

## ඇමුණුම අංක 02

### ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට විශ්වවිද්‍යාල සනාතන සභාව පිළිගත් වෙනත් සුදුසුකම්

(a) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වාණිජ්‍යය පිළිබඳ විශේෂ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.

(b) ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

(c) ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී තිබීම.

(d) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු ජාතික සහතිකය ලබා තිබීම.

(e) ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීන්ගේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී තිබීම.

(f) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(g) ශ්‍රී ලංකාවේ/ එක්සත් රාජධානියේ ගණකාධිකරණ ශිල්පීය ආයතනය පවත්වන විභාගයේ (AAT) සියලුම කොටස් සමත් වී සිටීම.

(h) ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ ඩිප්ලෝමාව ලබා තිබීම.

(i) එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවල දෙවන අදියර සමත් වී තිබීම.

(j) එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත් වී සිටීම.

**විමසීම් :**

සමායෝජක - වාණිජ විද්‍යා අධ්‍යයනාංශය

දු. ක. - 0112802513

වෙබ් අඩවිය : www.external.sjp.ac.lk

**ඇමුණුම 03**

## වර්ෂ අවසාන විභාගයට පෙනී නොසිටීමට හේතු වාර්තා කිරීම

යම් බාහිර උපාධි පාඨමාලාවක පරීක්ෂණයකට ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයෙකුට පහත සඳහන් කරුණු යටතේ සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂයකට/විෂයයන් කිහිපයකට පෙනී සිටීමට නොහැකි වුවහොත් පරීක්ෂණයට පෙනී නොසිටීමට පිළිගත් හේතු සහිත අදාළ ලේඛන දී ඇති උපදෙස් පරිදි ඉදිරිපත් කළ හැකිය. එසේ ඉදිරිපත් කරන ලේඛන FMSC කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශයෙන් පසුව සනාතන සභාව විසින් අනුමත කළ යුතුය. වෛද්‍ය සහතිකය පිළිගත හැකි එකක් නම් පාඨමාලා ඒකකය සඳහා උපාධි අපේක්ෂකයාට ප්‍රතිඵල ලේඛනයේ MC සංකේතය ලැබේ. MC හිමිකම ලැබූ අපේක්ෂකයාට ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකි වූ පරීක්ෂණයේ පුනර් පරීක්ෂණය පවත්වන අනුයාත වර්ෂයේදී වරප්‍රසාද සහිතව පෙනී සිටිය හැක. MC සංකේතය ලැබීමෙන් විභාග ගාස්තු නිදහස් කිරීමක් සිදු නොවේ. ඒ අනුව මුදල් ගෙවා පරීක්ෂණ අයදුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එහිදී විභාග අපේක්ෂකයා විසින් උපයාගත් මුළු ලකුණු ප්‍රමාණය හිමිවේ.

ඉහත සඳහන් පරිදි සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂයකට/විෂයයන් කිහිපයකට ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකිව MC හිමිකම ලැබුවේ නම් ප්‍රථම වරට පෙනී සිටීමට නොහැකි වූ පරීක්ෂණයේ පුනර් පරීක්ෂණය පවත්වන අනුයාත වර්ෂයේදී ද පුනර් පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් නැවත වරක් පහත සඳහන් පරිදි පරීක්ෂණයට පෙනී නොසිටීමට පිළිගත් හේතු ඉදිරිපත් කල හැකිය. විභාග නිර්ණායක අනුව MC හිමිකම අනුමත වනුයේ ප්‍රථම වරට පෙනී සිටින පරීක්ෂණයට සහ MC හිමිකම ලැබූ අනුයාත පුනර් පරීක්ෂණයකට පමණි. ඒ අනුව සම්පූර්ණ පරීක්ෂණයකට හෝ පරීක්ෂණයේ විෂයකට/විෂයයන් කිහිපයකට MC හිමිකම ලැබෙනුයේ උපරිම අවස්ථා දෙකක් පමණි.

**උදාහරණය 01-**

2021 අධ්‍යයන වර්ෂයේ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ සම්පූර්ණ පරීක්ෂණයටම පෙනී සිටීමට නොහැකිව පිලිගත හැකි හේතු ඉදිරිපත් කර MC හිමිකම ලැබුවේ නම් 2021 අධ්‍යයන වර්ෂයේ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයට ප්‍රථම වරට පෙනී සිටින අයෙකු ලෙස වරප්‍රසාදය හිමිවේ.

උදාහරණය 02-

2021 අධ්‍යයන වර්ෂයේ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණයේ COM 1501 විෂයට පෙනී සිටීමට නොහැකිව පිළිගත හැකි හේතු ඉදිරිපත් කර MC හිමිකම ලැබුවේ නම් සහ 2021 අධ්‍යයන වර්ෂයේ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණයේ COM 1501 විෂයට පෙනී සිටීමට නොහැකිවුයේ නම් නැවත වරක් පරීක්ෂණයට පෙනී නොසිටීමට පිලිගත් හේතු ඉදිරිපත් කර MC හිමිකම දෙවන වරටත් ලබා ගත හැකිය.

අවසාන විභාගයට පෙනී නොසිටීමට බලපාන හේතු පහත සංකේතයන්ගෙන් දැක්වේ.

- වෛද්‍ය හේතු මත විභාගයට පෙනී නොසිටීම MC
- පිළිගත හැකි හේතු මත විභාගයට පෙනී නොසිට කල් ගැනීම WP
- පිළිගත හැකි හේතුවක් නොමැතිව විභාගයට පෙනී නොසිටීම AB (මෙම තත්ත්වය පාඨමාලා ඒකකය අසමත් වීමක් ලෙස සලකනු ලැබේ.)
- පාඨමාලාවෙන් බැහැර කළ අවස්ථාවේදී WP

**විභාගයට පෙනී නොසිටීම සඳහා පිළිගත් හේතු**

උපාධි අපේක්ෂකයා බරපතළ ලෙස රෝගාතුර වීම, උපාධි අපේක්ෂකයාගේ මව, පියා, දරුවන්, කලත්‍රයා, සහෝදර සහෝදරියන්ගේ අභාවය, උපාධි අපේක්ෂකයාගේ විවාහය හෝ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් හේතුවක් පරීක්‍ෂණ සඳහා පෙනී නොසිටීමට පිළිගත හැකි හේතුවක් වේ. එබඳු අවස්ථාවක දී අදාල ප්‍රශ්න පත්‍රය සඳහා **විභාගය පැවැත්වෙන දින සිට දින 14ක් ඇතුළත රජයේ රෝහලකින් ලබා ගත් වෛද්‍ය සහතිකයක් සමඟ අප වෙබ් අඩවියෙහි http://external.sjp.ac.lk/examination-rules-and-regulations/ යටතේ ඇති Absence Justification අයදුම්පතද සහිතව බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ඉදිරිපත් කර විභාගය සඳහා පෙනී නොසිටීමට හේතුව තහවුරු කළ යුතුය.**

වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෛද්‍යවරයකුගෙන් නම් එය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි මගින් සහතික කරවා ගත යුතු අතර, වෛද්‍ය සහතිකය ලබා ගෙන ඇත්තේ **ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් නම් එය ආයුර්වේද රෝහලක වෛද්‍ය නිලධාරියකු මගින් සහතික කරවා ගත යුතුය.**

උපාධි අපේකෂකයාගේ විවාහය, විදේශගත වීම, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී ඊට අදාළ වන විභාගයට පෙනී නොසිටීම සනාථ කිරීමට වලංගු ලේඛන (විවාහ සහතික, වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර, පවුලේ ළඟම සාමාජිකයෙකුගේ අභාවයකදී නිසි පරිදි සහතික කළ මරණ සහතිකයක් ඥාතිත්වය තහවුරු කිරීමේ සහතික) හෝ පිළිගත් වෛද්‍ය සහතික බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. (අවමංගල්‍ය ශෝක ප්‍රකාශ මරණ සහතික ලෙස පිළිගනු නොලැබේ.)

## 6. විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ

බාහිර උපාධි පාඨමාලා සඳහා නියමිත සියලුම පාඨමාලා ඒකක සඳහා අදාල පාඨමාලාවට සම්බන්ධ ආචාර්යවරුන් විසින් ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ එක් විෂයක් සඳහා පැය 40 ක කාලයක් දේශන පවත්වනු ලබන අතර වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ එක් විෂයක් සඳහා පැය 30-40 ක කාලයක් දේශන පවත්වනු ලැබේ. සියලු දේශන මාර්ගගත ක්‍රමයට හෝ පටිගත කරන ලද වීඩියෝ පාඩම් වශයෙන් ඉදිරිපත් කෙරේ. මීට අමතරව එක් එක් පාඨමාලා ඒකකයන්ට අදාලව දැනුම පෝෂණය කර ගැනීම පිණිස ස්වයං අධ්‍යයනය සඳහා අවම වශයෙන් පැය 150 ක කාලයක් එක් එක් පාඨමාලා සඳහා වෙන් කළ යුතුය. මේ පිළිබඳව නිසි මාර්ගෝපදේශ අදාල ආචාර්යවරයා විසින් දේශන දැන්වත් කරනු ලැබේ.

වර්තමානයේ දේශන ශාලාවලට කැඳවා සිසුන් අභිමුඛයෙහි සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවට විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගනිමින් විෂය ප්‍රතිපෝෂක සමම්න්ත්‍රණ පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. එම ක්‍රමවේදයට අනුව විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පහත සඳහන් ආකාරයෙන් පවත්වනු ලැබේ.

1. සම්මන්ත්‍රණ විඩීයෝගත කර විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය හරහා (LMS) සිසුන් වෙත ලබා දීම.
2. සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවේදීම මාර්ගගත ක්‍රමයට (Online) සිසුන්ට ඊට සහභාගි වීමට අවස්ථාව සලසා දීම.

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් මෙහෙයවනු ලබන බාහිර උපාධි පාඨමාලාවලට අදාල ඒ ඒ විෂයයන්ට නියමිත විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වෙන ආකාරය පිළිබඳ තොරතුරු මෙන්ම සම්මන්ත්‍රණ පැවැත්වෙන දින සහ වේලාව සඳහන් සම්මන්ත්‍රණ කාල සටහන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කර කල් වේලා ඇතිව සිසුන් දැනුවත් කරනු ලැබේ.

# 7. විභාග අක්‍රමිකතා සහ දඬුවම්

## 1. විභාග අක්‍රමිකතා

බාහිර විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන් වෙත අභ්‍යන්තර සිසුන්ට අදාල විභාග අක්‍රමිකතා පිළිබඳව පවතින විනය පටිපාටිය එලෙසින්ම මෙම උපාධි පාඨමාලාව සඳහා ද ක්‍රියාත්මක වේ. විභාග ශාලාව තුළ විනය පවත්වාගෙන යාම සඳහා සෑම අපේක්ෂකයකුම සහාය විය යුතු වේ. පහත දක්වා ඇති විභාග අක්‍රමිකතා සිදුකිරීම බලවත් වරදක් වන අතර එවැනි විෂමාචාර ක්‍රියාවක යෙදුනහොත් විශ්වවිද්‍යාල සනාතන සභාව විසින් පනවා ඇති දඬුවම්වලට අපේක්ෂකයන් යටත්වනු ඇත. සියලු විභාග වලට පෙනී සිටින අපේක්ෂකයින් සඳහා විභාග පැවැත්වීමේ පටිපාටිය, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ නීතිරීති සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 292 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද ලේඛනය www.external.sjp.ac.lk වෙබ්අඩවියේ පළකර ඇත.

### විභාග අක්‍රමිකතා ලෙස සැලකෙන කරුණු

- සෙලියුලර් දූරකථන හෝ වෙනත් සන්නිවේදන උපකරණ පිළිතුරු ලියන අවස්ථාවේ ළඟ තබා ගැනීම සහ භාවිත කිරීම.
- ලිපිලේඛන සහ බල නොලත් වෙනත් ලේඛන සන්තකයේ තබා ගැනීම.
- විභාග ශාලාවේ දී විශ්වවිද්‍යාලය මගින් සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා ලේඛන ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම.
- පිළිතුරු ලිවීම සඳහා වෙනත් අයගෙන් උදව් ලබා ගැනීම.
- විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම.
- ප්‍රශ්න පත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැන ගැනීමට තැත් කිරීම.
- විභාග සම්බන්ධ යම් වරදක් කිරීමට ආධාර අනුබල ලබාදීම හා ලබා ගැනීම.
- අවසරයකින් තොරව විභාග ශාලාවෙන් පිටවීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ අනුබල දීම.
- කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ ඊට අනුබල දීම.
- විභාග ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට හෝ අනෙකුත් විභාග නිලධාරීන්ට බලපෑම් කිරීම.
- අසංවර හැසිරීම්, අනිසි බලපෑම් හා වෙනත් වංචනික ක්‍රියා සිදු කිරීම.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් විභාග අක්‍රමිකතාවක් ලෙස සැලකෙන වෙනත් ඕනෑම විභාග වංචනික ක්‍රියාවක් සිදු කිරීම.

## 2. විභාග අක්‍රමිකතා සඳහා ක්‍රියාත්මක දඬුවම්

- විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවයට / සමර්පණෝත්සවයට නොකැඳවීම.
- අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- පන්ති / සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.
- ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර දෙකකින් හෝ තුනකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර හතරකින් හෝ පහකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය අහෝසි කිරීම.
- ශිෂ්‍යයකු නොවන අවස්ථාවක දී ඔහුට/ඇයට එරෙහිව රටේ පවතින නීතියට අනුව ක්‍රියා කිරීම.
- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.

## 8. උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දී ඒ වනවිට සිය උපාධි ආවශ්‍යකතා සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් ට උපාධි ප්‍රදානය කරනු ලැබේ. උපාධි ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව සනාතන සභා අනුමැතියට යටත්ව, සමත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තාවකාලික සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවයට ඉල්ලුම් කිරීම හා විධිමත් උපාධි සහතිකයට අදාල ඉල්ලුම් පත්‍ර වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා කැඳවනු ලබන්නේ අයැදුම් කළහොත් පමණි. වාර්ෂිකව පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේදී අදාල අයදුම්කරුට විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ/ උපකුලපති අතින් උපාධිය ප්‍රදානය කෙරේ. යම් අයැදුම්කරුවකුට උපාධි ප්‍රදානෝත්සවයේ දී අභිමුඛයේ හෝ අනභිමුඛයේ උපාධි ලබාගත හැකිය. උපාධි ප්‍රදානෝත්සවයේ දී ප්‍රදානය කරනු ලබන මුල් සහතිකයේ පිටපත් හෝ අනුපිටපත් නැවත නිකුත් කරනු නො ලැබේ. උපාධි ප්‍රදානෝත්සවය සඳහා අභිමුඛයේ හෝ අනභිමුඛයේ ඉදිරිපත්වන උපාධිලාභීන් සඳහා උපාධි ලෝගුව සහ සාටකය නැවත විශ්වවිද්‍යාලයට භාර දී ඒ බව වාර්තා පොතේ සටහන් කරවා ගතයුතුය.

## බාහිර උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ අවධානය පිණිසයි.

1. බාහිර උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන පෞද්ගලික ආයතනයක සේවය කරන ආචාර්යවරයකු ප්‍රශ්න පත්‍ර සැකසීම, ප්‍රමිත කිරීම, පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම හෝ කිසිදු අදාල පරීක්ෂණ කටයුත්තක් සඳහා සහභාගි කරගනු නොලැබේ.

2. විශ්වවිද්‍යාලයේ අධීක්ෂණය යටතේ අධ්‍යයනාංශ ප්‍රධානවරුන්ගේ හා පීඨාධිපතිගේ නිර්දේශයන් හා අධ්‍යයන මණ්ඩලයේ හා පීඨමණ්ඩලයේ අනුමැතියලත් ආචාර්යවරුන්ට පමණක් දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීමට අවස්ථාව හිමිවේ.

3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පිරිනමනු ලබන සියලුම බාහිර උපාධි පාඨමාලා ලියාපදිංචි කිරීමේ සිට සියලුම කටයුතු මෙහෙයවනු ලබන්නේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් වන අතර එම කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් වෙනත් කිසිඳු ආයතනයක් මැදිහත් වීමක් සිදු නොවන බවත් එවැනි ආයතනයන්ට මුදල් ගෙවීම් සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකීමක් නොදරන බවත් අවධාරණය කරනු ලැබේ.

4. මෙම අත්පොතෙහි දක්වා ඇති ක්‍රමවේදයන්ගෙන් බැහැරව වෙනත් පාර්ශවයකගේ උපදෙස් මත කටයුතු කිරීම තුළින් උද්ගතවන ගැටලු විසඳා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිවක් සැලකිල්ලට නොගන්නා අතර ඒවාට පිළිතුරු යොමු නොකරන බවද අවධාරණය කරනු ලැබේ. එබැවින් මෙම ශිෂ්‍ය අත්පොතේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගත යුතු අතර, අදාල උපාධි පාඨමාලාව හදාරා අවසන් වනතුරු මෙම අත්පොත සුරැකිව තබාගෙන ඊට අනුව කටයුතු කරන ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

5. බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන් විසින් පිහිටුවා ගනු ලබන සංසද හෝ වෙනත් සංවිධාන සඳහා විශ්වවිද්‍යාලය මගින් නිල වශයෙන් අවසර නොදෙන බැවින් ඒ පිළිබඳව සිදු කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. විශ්වවිද්‍යාලයේ අවසරයකින් තොරව කිසිදු ආකාරයේ කටයුත්තක් සඳහා එහි නිල ලාංඡනය භාවිතා කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

6. මෙම අත්පොතේ සඳහන් ඕනෑම කරුණක් අවශ්‍යතාව අනුව පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතු වේ. එබඳු සංශෝධන වෙත්නම් ඒවා බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ.

**සියලුම බාහිර උපාධි පාඨමාලාවන්ට අදාල වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය ආදී සියලු කටයුතු සඳහා දැනුවත් කිරීම් www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් සිදුකරනු ලැබේ. තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ. එබැවින් නිතර නිතර අපගේ වෙබ් අඩවිය වෙත පිවිස අදාල ශීර්ෂ යටතේ ඇති නිවේදන පිළිබඳ දැනුවත් වීම අනිවාර්ය වේ.**

## විමසීම්


දු.ක. ඃ +94 112801481/ +94 113132496

ඊමේල් ඃ info.ext@sjp.ac.lk

වෙබ් අඩවිය ඃ external.sjp.ac.lk

විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය ඃ learnext.sjp.ac.lk

නියෝජ්‍ය ලේඛකාධිකාරී,

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල, නුගේගොඩ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**ගංගොඩවිල නුගේගොඩ**

දුරකථන : +94 2801481/ +94 3132496
ඊමේල් : info.ext@sjp.ac.lk
වෙබ් අඩවිය : www.external.sjp.ac.lk
විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය : www.learnext.sjp.ac.lk